*සැ. යු.-* මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2018 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයන්ගේ නාමාවලියත් ත්‍රෛයි භාෂාවෙන් පළවේ. (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,066 - 2018 අප්‍රේල් මස 06 වැනි සිකුරාදා - 2018.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 724 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 738 |

*සැ. යු.* - (i)


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 අප්‍රේල් මස 27 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අප්‍රේල් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

721 - B 81269 — 5,403 (2018/04)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු - පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න හා මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

05. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

06. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 මැයි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මාර්තු මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | කල්පිටිය | කල්පිටිය නගරය කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |
| පුත්තලම | කල්පිටිය | නොරොච්චෝලේ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |

04 - 247

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු - පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 මැයි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මාර්තු මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | කල්පිටිය | තලවිල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ කල්පිටිය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |
| පුත්තලම | කල්පිටිය | කුරිඤ්ඤම්පිටිය කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ කල්පිටිය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |
| පුත්තලම | මුන්දලම | මුන්දලම කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ පුත්තලම්පත්තු කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |

04 - 248

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු - මන්නාරම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න හා මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

05. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

06. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 මැයි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මාර්තු මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මන්නාරම | මන්නාරම නගරය | මන්නාරම නගර නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ වෛද්‍ය (දෙමළ මාධ්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම. |

04 - 249

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු - මන්නාරම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 මැයි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මාර්තු මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මන්නාරම | මන්නාරම නගරය | මාන්තෙ දකුණ කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මන්නාරම නගර කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම. |
| මන්නාරම | මන්නාරම නගරය | තලෙමන්නාරම කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මන්නාරම නගර කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම. |

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මන්නාරම | නානාට්ටන් | මුරුංගන් කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා නානාට්ටන් කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම |
| මන්නාරම | මාන්තෛ බටහිර | පෙරුන්කලෛපත්තු කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මාන්තෛ බටහිර කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම |
| මන්නාරම | මුසලි | පෙරියපොල්ලාච් පොට්කේනි කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මුසලි කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම |

04 - 250

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

දෙමළ භාෂාවෙන් උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (සාමාන්‍ය)
රෙජිස්ට්‍රාර් තනතුරු - වව්නියා දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 මැයි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මාර්තු මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| වවුනියාව | වවුනියාව උතුර | මේල්පත්තු නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව |

04 - 251

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය)
රෙජිස්ට්‍රාර් තනතුරු - වව්නියා දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 මැයි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මාර්තු මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| වවුනියාව | වවුනියාව දකුණ | කිලක්කුමූලයි දකුණ කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය (සිංහල මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව. |
| වවුනියාව | වවුනියාව දකුණ | මාමඩුව කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය (සිංහල මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව. |

04 - 252

---

**ජාතික සමාජ සංවර්ධන ආයතනය**

(සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන හා කන්දඋඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය)

**අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන්**

**01. තනතුර : ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරි - තනතුරු 03**

01. වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

**බාහිර අයදුම්කරුවන්**

02. අධ්‍යාපන සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්විද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධියක් තිබීම ;

හා

රජයේ හෝ රජයේ පිළිගත් ආයතනයක වසර 10කට නොඅඩු සමාජවැඩ පුහුණු කිරීමේ අංශයන්හි පළපුරුද්දක් තිබීම ;

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යාවන්ගෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම

හා

03. පළපුරුද්ද : රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 15 කට නොඅඩු සමාජවැඩ පුහුණු/පර්යේෂණ අංශයන්හි පළපුරුද්දක් තිබීම ;

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

(අ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු නිලධාරි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05ක පළපුරුද්දක් ලබා තිබීම ;

හෝ

(ආ) සමාජීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධියක් තිබිම හා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු නිලධාරි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම ;

04. සම්මුඛ පරීක්ෂණය : සඳහා ලකුණු ක්‍රමය

| | |
|---|---|
| අදළ ක්ෂේත්‍රයේ පලපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක වෘත්තිය පළපුරුද්ද | ලකුණු 30 |
| වෙනත් කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | ලකුණු 25 |
| | ලකුණු 100 |

05. වැටුප් පරිමාණය : AR -2-2016 - 71,585 - 10 x 1,910 =90,685 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.
AR - 2 - 2006A - 34,550 - 10 x 925 - 43,800 (මාසිකව) 2018 මූලික වැටුප රු. 56,771/-

**02. තනතුර : ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි - තනතුරු 03**

01. වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවු. 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සාමාජීය විද්‍යාවන්ගේ ආචාර්ය උපාධියක් ලබා තිබීම ;

හා

රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 10කට නොඅඩු සමාජවැඩ පර්යේෂණ අංශයන්හි පළපුරුද්ද ලබා තිබීම ;

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යාවන්ගෙන් ප්ශ්චාත් උපාධියක් ලබා තිබිම ;

හා

03. පළපුරුද්ද : රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 15කට නොඅඩු සමාජවැඩ පර්යේෂණ අංශයන්හි පළපුරුද්දක් තිබීම ;

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

(අ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පර්යේෂණ නිලධාරි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05ක පළපුරුද්දක් ලබා තිබීම

*හෝ*

(ආ) සමාජීය විද්‍යාවන්ගේ ආචාර්ය උපාධියක් තිබීම හා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පර්යේෂණ නිලධාරි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

04. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | |
|---|---|
| අදළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | ලකුණු 30 |
| අදළ අතිරේක වෘත්තීය පළපුරුද්ද | ලකුණු 30 |
| වෙනත් කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | ලකුණු 25 |
| | ලකුණු 100 |

05. *වැටුප් පරිමාණය* : AR -2-2016 - 71,585 - 10 x 1,910 = රු. 90,685 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.
AR - 2 - 2006A - 34,550 - 10 x 925 - රු. 43,800 (මාසිකව) 2018 මූලික වැටුප රු. 56,771/-

**03. තනතුර : කථිකාචාර්ය II - තනතුරු 04**

01. *වයස් සීමාව* : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩි වියයුතුය. (දැනට රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ මෙම ආයතනයේ සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. *අධ්‍යාපන සුදුසුකම්* :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජ වැඩ (Social work) පිළිබඳ පළමු හෝ දෙවන පන්තියේ (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත උපාධියක් ලබා තිබීම

*හෝ*

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ලබා ගත් ප්‍රථම උපාධිය සමග සමාජ වැඩ (Social work) පශ්චාත් උපාධියක් ලබා තිබීම.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | |
|---|---|
| අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක වෘත්තීය පළපුරුද්ද | ලකුණු 30 |
| වෙනත් කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | ලකුණු 25 |
| | ලකුණු 100 |

05. *වැටුප් පරිමාණය* : AR -1-2016 - 51,285 - 5 x 1,135 - 5 x 1,335 - 15 x 1,590 = රු. 87,485 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.
AR - 1 - 2006A - 24,725 - 5 x 550-5 x 645-15x770- රු. 42,250 (මාසිකව) මූලික වැටුප 2018 රු. 40,661/-

**04. තනතුර සහකාර පුස්තකාලයාධිපති II - තනතුරු 01**

01. *වයස් සීමාව* : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. *අධ්‍යාපන සුදුසුකම්* :

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධිය සමග රජය පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකට අයත් පුස්තකාලයක පුස්තකාලයාධිපතිවරයෙකු ලෙස අවම වශයෙන් අවුරුදු 03 කට නොඅඩු පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ කළමනාකරණ සහකාර I ශ්‍රේණියේ (තාක්ෂණික නොවන) තනතුරක පරිපාලන කටයුතු සම්බන්ධ වසර 05ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම ;

*හෝ*

ආශ්‍රිත නිලධාරි, ක්‍රියාත්මක කිරීමේ/උපදේශන සේවාවන්හි තනතුරක අවම වශයෙන් අවුරුදු 05කට නොඅඩු පළපුරුද්ද.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | |
|---|---|
| අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක වෘත්තීය සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | ලකුණු 25 |
| | ලකුණු 100 |

04. *වැටුප් පරිමාණය* : JM 1-1 - 2016 - 42,600 - 10 x 755 - 18 x 1,135= රු.70,580 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

JM 1-1 - 2006A - රු. 20,525 - 365 x 10 - 550 x 18 - රු. 34,075/= (මාසිකව) 2018 මූලික වැටුප රු. 33,770/-

**05. තනතුර : ඉංග්‍රීසි උපදේශක III - තනතුරු 01**

01. *වයස් සීමාව* : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩිවිය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. *අධ්‍යාපන සුදුසුකම්* :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව විෂයයක් සහිතව ලබා ගත් උපාධියක් ;

*හෝ*

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂාව, ඉංග්‍රීසි සාහිත්‍ය, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් ක්‍රමවේදය සහිත උපාධිය ;

*සහ*

(ඇ) ඉංග්‍රීසි ඉගැන්වීම් පිළිබඳ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම ;

*හෝ*

(ඉ) ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ රජයේ පාසලක හෝ වෙනත් රජයේ උසස් අධ්‍යාපන ආයතනයක වසර 03කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | |
|---|---|
| තනතුරට අදළ විෂයානුබද්ධ පලපුරුද්ද | ලකුණු 30 |
| තනතුරට අදළ අතිරේක සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් දක්ෂතා හා කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ පෙනී සිටීමේ කුසලතාවය | ලකුණු 25 |
| | ලකුණු 100 |

04. *වැටුප් පරිමාණය* : MA 4 - 2016 - රු. 37,970 - 10 x 755 - 15 x 930 -5 x 1,135= රු. 65,145 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

MA 4 -2006A - 18,230 - 10 x 365 -15 x 450 - 5 x 550- රු. 31,380/- (මාසිකව) 2018 මූලික වැටුප - රු. 30,074/-

**06. තනතුර : භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) III - තනතුරු 01**

01. *වයස් සීමාව* : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. *අධ්‍යාපන සුදුසුකම්* :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සිංහල/ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා ගත් උපාධියක් සහ අ.පො.ස. උසස්පෙළ සිංහල හා ඉංග්‍රීසි භාෂාව/සාහිත්‍යයට සම්මාන සමාර්ථයක් ලබා ගැනීම සහ සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්ථනය පිළිබඳ නිපුනතාවය ;

සහ

(ආ) රජයේ හෝ රජය පිළිගත් ආයතනයක සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්තකයෙකු ලෙස වසර 02ක පළපුරුද්ද.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | |
|---|---|
| තනතුරට අදළ විෂයානුබද්ධ පළපුරුද්ද | ලකුණු 30 |
| තනතුරට අදළ අතිරේක සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් දක්ෂතා හා කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමේ කුසලතාවය | ලකුණු 25 |
| | ලකුණු 100 |

04. *වැටුප් පරිමාණය* : MA 4 - 2016 - රු. 37,970 - 10 x 755 - 15 x 930 -5 x 1,135= රු. 65,145 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 වැනි දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

MA 4 -2006A - රු. 18,230 - 10 x 365 -15 x 450 - 5 x 550- රු. 31,380/- (මාසිකව) 2018 මූලික වැටුප - රු. 30,074/-

**සියළුම තනතුරු සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :**

1. තනතුර ස්ථිරය.
2. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
3. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

*සටහන* : මෙම තනතුරු පුරප්පාඩුව පවතින්නේ ප්‍රධාන කාර්යාලයේ වන අතර තෝරා ගන්නා අය ප්‍රධාන කාර්යාලයේ සේවය කල යුතුය.

සේවා කොන්දේසි : - 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධි විධානවලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීති රීති හා රෙගුලාසිවලට යටත් විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමවේදය : - පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීවදත්ත තොරතුරු ඇතුලත් අයදුම්පත් පහත දක්වා ඇති ලිපිනයට 2018.05.02 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ලිපිකවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතුය.

ඉහත උපදෙස් අනුව ඉදිරිපත්කොට නොමැති, අසම්පූර්ණ අපැහැදිලි හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම තනතුර ලබා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත. කෙටි ලැයිස්තුගත කිරීමෙන් සුදුසකම් ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, මෙම පත්වීම සම්බන්ධව ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පාලක සභාවේ තීරණය අවසන් තීරණය වේ.

ආචාර්ය රිඩ්ලි ජයසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

2018 මාර්තු මස 23 වැනි දින,
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
අංක 488 ඒ, නාවල පාර, රාජගිරිය.

04 - 367

---

## කෘෂිකර්ම අමාත්‍යාංශය

### ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය(PL 01 - 2006A) යටතේ III වන ශ්‍රේණියේ මුරකරු හා කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීමට ඉල්ලුම්පත් කැඳවීම - 2018

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිවයින පුරා පුරප්පාඩු වී ඇති මුරකරු හා කම්කරු තනතුරු සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි:*

1.1 මුරකරු තනතුරු සඳහා පිරිමි අයදුම්කරුවන් පමණක් ද, කම්කරු තනතුරු සඳහා කාන්තා සහ පිරිමි යන දෙපාර්ශයටම ද අයදුම් කල හැකිය .

1.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත්වේ. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු අතර, රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

1.3 රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් 2009.02.20 දිනැති අංක1589/30 *ගැසට් පත්‍රයේ* පළ කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අදාළ වේ.

1.4 තෝරාගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද , මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝග වලට ද, කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලට ද, යටත් විය යුතුය.

2. *සාමාන්‍ය සුදුසුකම්:*

2.1 ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

2.2 යහපත් චරිතයකින් හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු , මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

2.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි පුද්ගලයන් වියයුතුය.

2.4 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතින්හි V වන පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතුය.

3. *අධ්‍යාපන සුදුසුකම්:*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

4. *වෙනත් සුදුසුකම්:*

4.1 වෙනත් අධ්‍යාපනික සුදුසුකම්, ක්‍රීඩා කුසලතා හා විශේෂ පුහුණු සහතික පත්‍ර විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.

4.2 සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

5. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කම්කරු හා මුරකරු තනතුරේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ. අයදුම්කරුවන්

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍ය පැහැදිලිවම අයදුම්පතේ සඳහන් කළ යුතුය.

6. *වැටුප් පරිමාණය (මාසික) :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි PL 1- 2016 වැටුප් ඛාණ්ඩය යටතේ රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x330 - රු. 36,410/- වේ.

7. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ තමන් විසින් ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර, අයදුම්පත්‍රය 2018.05.04 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ.පෙ. 537, කොළඹ 07, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. බඳවා ගැනීමට සුදුසුකම් ලබන සියළුම නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටින බැව් අවධාරණය කරන අතර පළමු පත්වීම ලබන දිස්ත්‍රික්කය තුල අවම ලෙස වසර 05 ක් වත් සේවය කිරීම අත්‍යවශ්‍ය වන අතර අයදුම්පත් භාරගන්නා අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. අයදුම්කරුවන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කල යුතුය.

8.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත්‍රය.

8.2 වලංගු විදේශ ගමන් බලපත්‍රය,

8.3 වලංගු රියදුරු බලපත්‍රය.

9. මුරකරු තනතුර සඳහා ඉල්ලුම්කරනු ලබන අයදුම්කරුවන් පමණක් මාස 03ක් ඇතුලත ලබාගත් ග්‍රාමසේවා සහතිකයක් සහ පොලිස් වාර්තාවක් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

10. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් වන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2018 මාර්තු මස 23 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
තැ.පෙ. 537,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ මුරකරු හා කම්කරු තනතුරු සඳහා වන අයදුම්පත්‍රය**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

අයදුම් කරන භාෂා මාධ්‍යය :
සිංහල (2)
දෙමළ (3)
ඉංග්‍රීසි (4) (අදාළ අංකය යොදන්න)

ඉල්ලුම් කරන තනතුර :
(කොටුව තුළ කතිරය යොදන්න)

| මුරකරු | | කම්කරු | |
|---|---|---|---|

1. ස්ත්‍රී පුරුෂ භාවය :
(කොටුව තුළ කතිරය යොදන්න) ස්ත්‍රී පුරුෂ

2. විවාහක/අවිවාහක බව :
(කොටුව තුළ කතිරය යොදන්න)

| විවාහක | | අවිවාහක | |
|---|---|---|---|

3. මුලකුරු සමග නම : ..............................................................................................................................

4. සම්පූර්ණ නම : ..............................................................................................................................

5. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

6. ස්ථිර ලිපිනය : ..............................................................................................................................

..............................................................................................................................

7. උපන්දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

8. වයස : අවු : | | | මාස : | | | දින : | | |
(අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට)

9. දුරකථන අංකය : | | | | | | | | | | |

10. අධ්‍යාපන සුදුසුකම් :

| පළමුවර | | | දෙවනවර | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | | | වර්ෂය | | |
| විභාග අංකය | | | විභාග අංකය | | |
| අනු අංකය | විෂය | ශ්‍රේණිය | අනු අංකය | විෂය | ශ්‍රේණිය |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

11. වෙනත් සුදුසුකම් :
..........................................................................................
..........................................................................................

12. සේවය කිරීමට කැමති දිස්ත්‍රික්ක 05ක් තම අභිමතය පරිදි ප්‍රමුඛතා පදනම මත :

1. ............................................
2. ............................................
3. ............................................
4. ............................................
5. ............................................

13. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න. ඔව් නම් විස්තරය සඳහන් කරන්න.)

නැත ☐ ඔව් ☐

.......................................................................................................
.......................................................................................................
.......................................................................................................

14. අයදුම්කරුගේ සහතිකය :

අ. මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කරුණක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟවෙමි. තව ද, මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

ආ. මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

දිනය:.....................  ........................................
අයදුම්කරුගේ අත්සන

04-437

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

### ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව
### ආධුනිකයින් බඳවා ගැනීම - 2018 ජූලි

ශ්‍රී ලංකා ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන මොරටුව කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයෙහි පහත සඳහන් පූර්ණ කාලීන පාඨමාලා හැදෑරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

1. *පවත්වනු ලබන පූර්ණ කාලීන පාඨමාලා :*

| | පාඨමාලාවේ නම | ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) | කාලය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පි (විශේෂ) | - | අවු. 03 | අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් සමග අ.පො.ස (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය සහ විද්‍යාව සමග විෂයයන් හයක් සමත් වී තිබීම. *හෝ* අ.පො.ස (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය හෝ තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන් 2න් එක් විෂයකට සාමාර්ථයක් ලබා තිබීම හා අ.පො.ස (සා. පෙළ) සිංහල භාෂාව, විද්‍යාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 6ක් සමත් වී තිබීම. |
| 02. | විදුලි කාර්මික ශිල්පි (විශේෂ) | 4 වන මට්ටම | අවු. 03 | |
| 03. | ඉදිකිරීම් සුපරීක්ෂක | 4 වන මට්ටම | අවු. 01 1/2 | |
| 04. | ශීතකරණ හා වායු සැකසුම් කාර්මික ශිල්පි | 4 වන මට්ටම | අවු. 02 | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් සමත් වීම. |
| 05. | යන්ත්‍ර කාර්මික ශිල්පි (විශේෂ) - Machinist (Special) | 4 වන මට්ටම | අවු. 03 | |
| 06. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී - (ICTT) | 4 වන මට්ටම | අවු. 01 | අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් සමත්වීම සහ අංක 06, 07 සඳහා මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම. |
| 07. | පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පී | 4 වන මට්ටම | අවු. 01 1/2 | |
| 08. | පෑස්සුම් ශිල්පි (විශේෂ) - Welder (Special) | 4 වන මට්ටම | අවු. 03 | අවම වශයෙන් අ.පො.ස (සා.පෙළ) දක්වා අධ්‍යාපනය ලැබීම. |
| 09. | ජලනල කාර්මික ශිල්පී | 4 වන මට්ටම | අවු. 02 | |
| 10. | දැව කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) | 4 වන මට්ටම | අවු. 02 | |
| 11. | මූලික පොත් බඳින්නා | - | අවු. 01 | අවම වශයෙන් 09 වන වසර දක්වා අධ්‍යාපනය ලැබීම. |

02. *වයස* : 2018.04.20 වැනි දිනට අවුරුදු 16ට නොඅඩු 35 ට නොවැඩි විය යුතු ය.

03. *පුහුණුව පිළිබඳ විස්තර :*

3.1 සියලුම පාඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැලසුම් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණුවේ පළමු භාගයේ දී මූලික පුහුණුව ආයතනය තුළ දී ලබාදේ. පුහුණුවේ දෙවන භාගයේ දී වැඩිදුර පුහුණුව සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ. සියලුම වෘත්තීන් සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් අතිශයින් වැඩි වී ඇත.

04. *තෝරා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්.

05. *අයදුම්පත් එවිය යුතු ආකාරය :*

5.1 පහත දක්වා ඇති ආකෘතියට අනුව "11 1/2 x 8 1/4" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියල කරගත් හෝ www.naita.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත් ඉල්ලුම්පත් 2018 අප්‍රේල් මස 20 වන දිනට පෙර අධ්‍යක්ෂ/ විදුහල්පති, කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංකඃ 581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ ''ආධුනිකයින් බඳවා ගැනීම 2018 ජූලි'' යන්න සඳහන් කළ යුතු අතර, ඔබගේ ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් ඔබගේ ඉල්ලුම්පත සමඟ එවිය යුතු ය.

5.2 එක් අයදුම්කරුවෙකු තමන් කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් ඉල්ලුම්පතේ සඳහන් කළ යුතු ය.

5.3 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පූර්ණ කාලීන පාඨමාලාවක් දැනට හදාරණ අයට මේ සඳහා අයදුම්කළ නොහැක.

5.4 තැපෑලේ දී නැතිවන හෝ ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය වගකියනු නොලැබේ. ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

ශෙහාන් සෙනෙවිරත්න.
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ
කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

2018 මාර්තු මස 21 වැනි දින,
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව**
**ආධුනිකයන් බඳවා ගැනීම - 2018 ජූලි**

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

ආදර්ශ අයදුම්පත්‍රය (''11 1/2 x 8 1/4'' (A4) ප්‍රමාණයේ)

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :- ........................................ මයා/මිය/මෙනෙවිය
2. මුලකුරු සමග නම :- ........................................
3. ලිපිනය :- ........................................
4. පදිංචිය i. ප්‍රාදේශීය ලේකම් කෝට්ඨාසය :- ........................................
   ii. දිස්ත්‍රික්කය :- ........................................
5. දුරකථන අංකය :- නිවස : ........................ ජංගම : ........................
6. උපන් දිනය :- ........................................
7. ජාතික හැඳුනුම්පත් අංකය :- ........................................
8. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම X ලකුණින් සලකුණු කරන්න)

| අ.පො.ස (උ.පෙළ) | | අ.පො.ස (සා.පෙළ) | | 8 වන ශ්‍රේණිය | |
|---|---|---|---|---|---|

අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල :

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස (උ.පෙළ) ප්‍රතිඵල :

| | විෂයයන් | සාමාර්ථයන් | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

| හදාරා ඇති පරිගණක පාඨමාලාවන් |
|---|
| |

9. ඔබගේ සුදුසුකම් අනුව ඔබ විසින් හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් සඳහන් කරන්න.

1. ........................................................................................................
2. ........................................................................................................
3. ........................................................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරමි.

....................................... ..........................................
දිනය අයදුම්කරුගේ අත්සන.

04-235/1

---

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව

කර්මාන්තගත නව ආධුනිකත්ව පුහුණු ක්‍රමවේදය යටතේ ආධුනිකයින් බඳවා ගැනීම - 2018

1. පවත්වනු ලබන පාඨමාලා :

| | *පාඨමාලාවේ නම* | *ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)* | *කාලය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | මූලික කර්මාන්ත ඉලෙක්ට්‍රොනික් විද්‍යාව - Basic Industrial Electronics | - | අවු. 03 | අ.පො.ස (සා.පෙළ) විභාගයේදී ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් සමග අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ගණිතය සහ විද්‍යාව සමග විෂයයන් 6 ක් සමත් වී තිබීම. |
| 02. | විදුලි ශිල්පය - Electrcian | 3 වන මට්ටම | අවු. 03 1/2 | |
| 03. | යන්ත්‍ර ශිල්පී - Machinist | 3 වන මට්ටම | අවු. 03 1/2 | අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් සමත් වීම. |
| 04. | පරිගණක යෙදවුම් සහායක - Computer Application Assistant | - | අවු. 01 | අ.පො.ස (සා.පෙළ) විභාගයේදී ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථ ඇතුළුව විෂයයන් 6 ක් සමත් වී තිබීම. |
| 05. | පෑස්සුම් ශිල්පී - Welder | 3 වන මට්ටම | අවු. 03 | අවම වශයෙන් 9 වන වසර දක්වා අධ්‍යාපනය ලැබීම. |
| 06. | දැව කාර්මික ශිල්පය - Wood Craftsman | 3 වන මට්ටම | අවු. 03 | |
| 07. | විද්‍යාත්මක ජලනල ශිල්පය - Scientific Plumbing | - | අවු. 03 | |
| 08. | පෙදරේරු - Masonry | - | අවු. 04 | |

2. තෝරා ගැනීමේ ක්‍රමය :

සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ.

3. අයදුම්පත් එවිය යුතු ආකාරය :

3.1 පහත දක්වා ඇති ආකෘතියට අනුව "11 1/2 x 8 1/4" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරගත් හෝ www.naita.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත් ඉල්ලුම්පත් 2018 අප්‍රේල් මස 20 වැනි දිනට පෙර <u>අධ්‍යක්ෂ/ විදුහල්පති, කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංකඃ 581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව</u> යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ ''<u>කර්මාන්තගත නව ආධුනිකත්ව පුහුණු ක්‍රමවේදය යටතේ ආධුනිකයින් බඳවා ගැනීම - 2018</u>'' යන්න සඳහන් කළ යුතු අතර, ඔබගේ ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් ඔබගේ ඉල්ලුම්පත සමඟ එවිය යුතුය.

3.2 තැපෑලේදී නැතිවන හෝ ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය වගකියනු නොලැබේ. ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

ශෙහාන් සෙනෙවිරත්න,
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය,
අංක 971,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

**කර්මාන්තගත නව ආධුනිකත්ව පුහුණු ක්‍රමවේදය යටතේ ආධුනිකයින් බඳවා ගැනීම - 2018**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

| |
|---|
| පාඨමාලාව :- |
| මුලකුරු සමඟ නම :- |
| FULL NAME IN BLOCK LETTERS (සහතිකය නිකුත් කරනු ලබන්නේ මෙහි සඳහන් නමට පමණි) |
| ලිපිනය :- |
| උපන් දිනය :- ස්ත්‍රී පුරුෂ භාවය :- ජාතික හැඳුනුම්පත් අංකය :- |
| දුරකථන අංකය :- කාර්යාලය :- |
| අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම X ලකුණින් සලකුණු කරන්න) |

| අ.පො.ස (උ.පෙළ) | | අ.පො.ස (සා.පෙළ) | | 8 වන ශ්‍රේණිය | |
|---|---|---|---|---|---|

අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල :

| විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

අ.පො.ස (උ.පෙළ) ප්‍රතිඵල :

| විෂයයන් | සාමාර්ථයන් | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

| | |
|---|---|
| අයදුම්කරන පාඨමාලාවට අදාල වෙනත් සුදුසුකම් | |
| සේවය කරන ආයතනයේ නම සහ දරන තනතුර | |
| ඔබගේ සුදුසුකම් අනුව ඔබ විසින් හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් සකස් කරන්න. | i. ____<br>ii. ____<br>iii. ____ |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

............................................ ............................................
දිනය, අයදුම්කරුගේ අත්සන.

04-235/2

## තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය
## ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණිය සහ පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත හා සීමිත තරග විභාගය

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය සඳහා තනතුරු පුරප්පාඩු පිරවීමේ විවෘත හා සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය කොළඹ නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පැවැත්වේ.

01. පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | |
|---|---|---|---|
| | | *විවෘත* | *සීමිත* |
| 01 | කාර්මික නිලධාරී (සිවිල්) | 02 | 01 |
| 02 | රසායනාගාර කාර්මික | 02 | 01 |

02. බඳවා ගන්නා ක්‍රමය :

2.1 ලිඛිත තරග විභාගය :
*විභාගය පැවැත්වෙන දිනය* - මෙම විභාගය 2018 ජූලි මාසය තුළ පැවැත්වේ. විභාගය පැවැත්වෙන දිනය පසුව දැනුම් දෙනු ලැබේ. මෙම විභාගය අවලංගු කිරීමට හෝ කල් දැමීමේ අයිතිය විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :
ලකුණු ලබා නොදෙන අතර අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

2.3 ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලබන අතර, ලිඛිත විභාගය සමත් වන්නන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ. සමත් වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි. **තාක්ෂණ නිලධාරී (සිවිල්) හා රසායනාගාර කාර්මික III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් අය ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් පමණක් පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනේ.**

**03. 3.1 තාක්ෂණ නිලධාරී (සිවිල්) හා රසායනාගාර කාර්මික III ශ්‍රේණියේ තනතුරු**

3.1.1 මෙම පත්වීම් ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු වේ. තව ද වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු වේ.

3.1.2 තෝරාගත් අයදුම්කරුවන් පත්වීම ලද දින සිට වර්ෂ තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලැබේ.

3.1.3 එසේම 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 පරිදි මෙහි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳ නියමිත ප්‍රවීණතාවය ලබාගත යුතුය. (ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව වේ.)

**3.2 තාක්ෂණ නිලධාරී (සිවිල්) හා රසායනාගාර කාර්මික පුහුණු ශ්‍රේණියේ තනතුරු**

3.2.1 විවෘත ධාරාව හෝ සීමිත ධාරාව හෝ යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලබන අයදුම්කරුවන් අදාළ පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සත්වෝද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් අනුමත කරන ආයතනයක් විසින් පවත්වනු ලබන විභාගය සමත් වුවහොත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

3.2.2 පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන විවෘත ධාරාව යටතේ අයදුම් කළ ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලබන අතර සීමිත ධාරාව යටතේ අයදුම් කළ ආධුනිකයින් ඔවුන්ගේ පූර්ව තනතුරු වලට මුදාහැරේ.

04. 4.1 තාක්ෂණ නිලධාරී (සිවිල්) හා රසායනාගාර කාර්මික III ශ්‍රේණියේ තනතුරට හිමි මාසික වැටුප් පරිමාණ :

4.1.1 වැටුප් කේත අංකය : MN -03-2016

4.1.2 වැටුප් පරිමාණය : රු. 31,040-10x445-11x660-10x730-10x750 - රු. 57,550 (ගෙවීම් කටයුතු කරනු ලබන්නේ රා.ප.ච 03/2016 හි උපලේඛන II පරිදි වේ.)

4.2 තාක්ෂණ නිලධාරී (සිවිල්) හා රසායනාගාර කාර්මික පුහුණු ශ්‍රේණියට අදාළ මාසික දීමනාව :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන V හි සඳහන් පරිදි ගෙවීම් කරනු ලැබේ.

05. *වයස් සීමාව* :

5.1 විවෘත බඳවා ගැනීම (අයදුම්පත් කැඳවන අවසාන දිනට)

අවම වයස් සීමාව - අවුරුදු 18
උපරිම වයස් සීමාව - අවුරුදු 30

''ඒ අනුව 2000.05.02 දිනට හෝ ඊට පෙර හා 1988.05.02 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.''

5.2 *සීමිත බඳවා ගැනීම* - වයස් සීමාවක් නැත

සීමිත බඳවා ගැනීම් යටතේ සුදුසුකම් ලබන්නේ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් සහිතව තනතුරේ ස්ථිර කර ඇති අය පමණකි.

06. *කායික සුදුසුකම්* :

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

07. *සුදුසුකම්* :

7.1.1 විවෘත බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| තාක්ෂණ නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>අ.පො.ස උ. පෙළ විභාගයේ දී ගණිතය/විද්‍යාව විෂය ධාරාවේ භෞතික විද්‍යාව/රාසායන විද්‍යාව/ සංයුක්ත ගණිතය/ උසස් ගණිතය යන විෂයයන් අතරින් විෂයයන් 02 ක් සහිතව විද්‍යා/ ගණිත විෂය ධාරාවට අයත් විෂයන් 03 කින් එකවර සමත් වීම. |
| තාක්ෂණ නිලධාරි (සිවිල්) පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>අ.පො.ස උ. පෙළ විභාගයේ දී ගණිතය/විද්‍යාව හෝ තාක්ෂණවේදය විෂය ධාරාවේ භෞතික විද්‍යාව/රාසායන විද්‍යාව/ සංයුක්ත ගණිතය/ උසස් ගණිතය/ සිවිල් තාක්ෂණවේදය/ ඉංජිනේරු තාක්ෂණවේදය සඳහා විද්‍යාව විෂයයන් අතරින් විෂයයන් 2 ක් සහිතව විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් 03 කින් එකවර සමත් වීම. |
| තාක්ෂණ නිලධාරි (සිවිල්) පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) | සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>අ.පො.ස උ. පෙ විභාගයේ දී ගණිතය/ විද්‍යාව හෝ තාක්ෂණවේදය විෂය ධාරාවේ භෞතික විද්‍යාව/ රසායන විද්‍යාව/ සංයුක්ත ගණිතය/ උසස් ගණිතය/ සිවිල් තාක්ෂණවේදය/ ඉංජිනේරු තාක්ෂණවේදය/ තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් 2 ක් සහිතව විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් 03 කින් එකවර සමත් වීම. |
| රසායනාගාර කාර්මික III ශ්‍රේණිය | සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>අ.පො.ස උ.පෙ විභාගයේ දී ගණිතය/ විද්‍යාව විෂය ධාරාවේ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව යන විෂයයන් අතරින් විෂයන් 02 ක් සහිතව ගණිතය/ විද්‍යාව විෂය ධාරාවට අයත් විෂයයන් 03 කින් එකවර සමත් වීම. |

| තනතුරු | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|
| රසායනාගාර කාර්මික පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>අ.පො.ස උ.පෙ විභාගයේදී විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් එකකින් රසායන විද්‍යාව, ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යාව යන විෂයන් අතරින් 02 ක් සහිතව විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් 03 කින් එකවර සමත් වීම. |
| රසායනාගාර කාර්මික පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) | සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>අ.පො.ස උ.පෙ විභාගයේදී විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් එකකින් රසායන විද්‍යාව, ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යාව යන විෂයයන් අතරින් 02 ක් සහිතව විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් 03 කින් එකවර සමත් වීම. |

7.1.2 සීමිත බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් :

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|
| තාක්ෂණ නිලධාරි (සිවිල්)/රසායනාගාර කාර්මික (III ශ්‍රේණිය) | සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා. පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත් වීම. |
| තාක්ෂණ නිලධාරි (සිවිල්)/රසායනාගාර කාර්මික පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | |
| තාක්ෂණ නිලධාරි (සිවිල්)/රසායනාගාර කාර්මික පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) | |

7.2.1 විවෘත සහ සීමිත බඳවා ගැනීමේ වෘත්තීය සුදුසුකම් :

| තනතුර | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| තාක්ෂණ නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය | I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්)<br>හෝ<br>II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්)<br>හෝ<br>III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්)<br>හෝ<br>IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්)<br>හෝ<br>V. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම. (සිවිල්)<br>හෝ<br>VI. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

| තනතුර | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| තාක්ෂණ නිලධාරී (සිවිල්) පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | I. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සිවිල් ක්ෂේත්‍රයේ පාඨමාලාවක් සාර්ථකව හදරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම.<br>හෝ<br>II. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සිවිල් ක්ෂේත්‍රයේ කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතික ලබා තිබීම.<br>හෝ<br>III. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.<br>සහ<br>ඉහත වෘත්තීය සුදුසුකමක් සහිතව අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්දක් තිබිය යුතුය. |
| තාක්ෂණ නිලධාරී (සිවිල්) පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) | වෘත්තීය සුදුසුකම් අවශ්‍ය නැත. |
| රසායනාගාර කාර්මික III ශ්‍රේණිය | I. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| රසායනාගාර කාර්මික පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | I. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදරා ජාතික තාක්ෂණ (සිවිල්) සහතිකය ලබා තිබීම.<br>හෝ<br>II. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහන් වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතික ලබා තිබීම.<br>හෝ<br>III. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට අයත් සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.<br>සහ<br>ඉහත වෘත්තීය සුදුසුකමක් සහිතව අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්දක් තිබිය යුතුය. |
| රසායනාගාර කාර්මික පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) | වෘත්තීය සුදුසුකම් අවශ්‍ය නැත. |

8. පළපුරුද්ද :

සීමිත පුහුණුකිරීමේ ශ්‍රේණියට අදාළව වසරක හා දෙවසරක පුහුණු කාලය සඳහා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

9. වෙනත් ඃ

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
II. මනා චරිතයකින් යුක්ත විය යුතුයි.
III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
IV. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

10. ලිඛිත විභාගය ඃ

10.1 මෙම විභාගය විභාග කොමසාරිස්වරයා විසින් පවත්වනු ලැබේ.

| *විෂයයන්* | *ප්‍රශ්න පත්‍ර අංකය* | *ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය* | *ප්‍රශ්න සංඛ්‍යාව* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 1 | බහු වරණ | 50 | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය (තාක්ෂණ නිලධාරී) | 2 | ව්‍යුහගත | 20 | පැය 03 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය (රසායනාගාර කාර්මික) | 3 | ව්‍යුහගත | 20 | පැය 03 | 100 | 40% |

*සටහන* .- සෑම අයදුම්කරුවකුම 1 - බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රයට හා ප්‍රශ්න පත්‍ර 2,3 වන ඒවායින් එකකට ලෙස සම්පූර්ණ ප්‍රශ්න පත්‍ර දෙකකට පෙනී සිටිය යුතුය. මෙම ප්‍රශ්න පත්‍ර දෙකම එකම දිනයක පවත්වනු ලැබේ.

10.2 විෂය නිර්දේශය ඃ

| *තනතුර* | *විෂය නිර්දේශය* |
|---|---|
| තාක්ෂණ නිලධාරී | **01. බුද්ධි පරීක්ෂණය**<br>අයදුම්කරුගේ තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය සහ තීරණ හැකියාව වැනි කරුණු නිශ්චය කිරීම සඳහා සකස් කරනු ලබන මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත වනු ඇත.<br>**02. විෂයානුබද්ධ පරීක්ෂණය**<br>1. ගෘහ නිර්මාණ ශිල්පීය ඇඳීම.<br>1.1 ව්‍යුහමය ඇඳීම<br>1.2 සවි ගැන්වූ කොන්ක්‍රීට් තහඩු අත්තිවාරම්, යකඩ කාප්ප, කුලුණු ආදියෙහි ව්‍යුහමය ඇඳීම පිළිබඳ දැනුම.<br>2. ගොඩනැගිලි ද්‍රව්‍ය පිළිබඳව විස්තර<br>2.1 සිමෙන්ති, හුනු, කොන්ක්‍රීට් ගල්, ගඩොල්, දැව, සක්ක ගල්, තීන්ත හා වාර්නිෂ් වර්ග, ප්ලාස්ටික් හා වීදුරු, ගොඩනැගිලි ඉදි කිරීමේ දී ද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ආකාරය හා ඒවායේ ප්‍රමිතිය පිළිබඳ දැනුම.<br>3. ගොඩනැගිලි පරිමාණ මිනුම් පිළියෙල කිරීම හා ඇස්තමේන්තු කිරීම, ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීම සහ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි ද්‍රව්‍ය කම්කරුවන් සංඛ්‍යාව ඇස්තමේන්තු කිරීම.<br>4. මැනීම සහ මට්ටම ගැනීම.<br>4.1 දම්වැල් මිණුම, මට්ටම් ගැනීම, තියෝඩලයිට් භාවිතය පිළිබඳ සහ තල මේස මැනුම පිළිබඳ දැනුම. |

| තනතුර | විෂය නිර්දේශය |
|---|---|
| තාක්ෂණික නිලධාරී (සම්බන්ධිතයි) | 5. ගොඩනැගිලි ඉදිකිරීම.<br>5.1 අත්තිවාරම්, බිත්ති බැඳීම, දෘව වහලය, යකඩ කාප්ප, කුළුණු, කොන්ක්‍රීට් කුළුණු, අත්තිවාරම් තට්ටු, තරප්පු ආදිය යොදනු ලබන ආකාරය හා යොදනු ලබන අවස්ථා<br><br>6. ව්‍යුහ<br>6.1 ව්‍යාකෘති බල, නම්‍යතා පූර්ණ බල සටන් ආදිය ගණනය සහ නිර්මාණය<br><br>7. සේවාවන්<br>7.1 විදුලි, ජල, සනීපාරක්ෂක<br><br>8. ආරක්ෂිත ක්‍රම<br>8.1 වැඩපලක තිබිය යුතු ආරක්ෂිත ක්‍රම |
| රසායනාගාර කාර්මික | **01. බුද්ධි පරීක්ෂණය**<br>අයදුම්කරුගේ තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය සහ තීරණ හැකියාව වැනි කරුණු නිශ්චය කිරීම සඳහා සකස් කරනු ලබන මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත වනු ඇත.<br><br>**02. විෂයානුබද්ධ පරීක්ෂණය**<br>1. රසායනාගාර තාක්ෂණ වල මූලධර්ම හා ප්‍රගුණ කිරීම<br>1.1 අනුජීව විද්‍යාව<br>1.2 රසායන විද්‍යාව<br>1.3 රක්ත වේදය<br>1.4 සායන ව්‍යාධිවේදය<br>1.5 පටක ව්‍යාධිවේදය<br><br>2. රසායනාගාර කළමනාකරණ<br>3. රසායනාගාර උපකරණ නඩත්තුව හා අළුත්වැඩියා කිරීම.<br>4. රසායනාගාර ආරක්ෂා පිළිවෙල<br>5. රසායන ද්‍රව්‍ය සපයා ගැනීම, ගබඩා කිරීම, නිකුත් කිරීම හා ගණන් තැබීම.<br>6. ප්‍රයෝජනයට ගත නොහැකි රසායනාගාර උපකරණ හා භාණ්ඩ ඉවත් කිරීම.<br>7. රසායනාගාර සාම්පල කළමනාකරණය<br>8. රසායනාගාරයක සිදුවිය හැකි හදිසි තත්ව කළමනාකරණය<br>9. රෝග විනිශ්චය හා පර්යේෂණ සඳහා පශු වෛද්‍ය විද්‍යාවේ භාවිතයන් හා සම්බන්ධතා |

11. *විභාග ප්‍රතිඵල :*

විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk යන වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

12. *විභාග කොන්දේසි :*

12.1 විභාග සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්කරුවන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අයදුම්කරුවන් මෙම විභාගයේ සියලු ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුයි. අයදුම්කරුවකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දක්වෙන භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අයදුම්කරුවකුටම තමාට නියමිත ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතුය. සීමිත විභාගයකට පෙනී සිටීමට සුදුසුකම් ඇති වන් විවෘත විභාගයට ද පෙනී සිටීමට සුදුසුකම් සපුරා ඇත්නම් එකම අයදුම්පත්‍රයක් භාවිතා කරමින් අයදුම්පත් යොමුකළ හැකි වේ.

12.2 විභාග ගාස්තුව රු. 600/- කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක්/ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස අලවන්න. විභාග ගාස්තුව සඳහා කිසිදු අවස්ථාවක මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද මුදල මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලබන අතර, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් නොකරන බව ද දන්වමි. එම ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12.3 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී විභාග අයදුම්කරුගේ අනන්‍යතාවය, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛනවලින් පමණක් ඕනෑම එකක් පිළිගනු ලැබේ.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

*සටහන* - විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

අයදුම්කරුවකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12.4 ඉල්ලුම් පත්‍රය සෙ.මී. 21-29.7 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර ශීර්ෂ අංක 01 සිට 03.1 අනු ශීර්ෂය තෙක් පළමු පිටුවට ද 03.2 අනු ශීර්ෂය සිට ඉදිරියට ඇති ශීර්ෂ පිළිවෙලින් අනිත් පිටුවලට ද ලෙස ගෙන සකස් කළ යුතු බවත් ඊට අදාළ තොරතුරු විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු වේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබෙන බැවින් අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම මෙම විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුලත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට අලවා ඇත්තද යන්න පිළිබඳවත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීමටත් විමසිලිමත් වන්න.

12.5 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් -

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත් නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අයදුම්කරුවකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාග යට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාග යෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. කිසිවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

13. 13.1 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාලාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගත හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ලඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද, ප්‍රයෝජනවත් වනු ඇත.

13.2 විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොසමාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවන ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13.3 අයදුම්කරුගේ අනන්‍යතාව -

විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් සෑම අයදුම්කරුවකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර තිබිය යුතුය.

14. රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/

ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කරවා ගත යුතුය. එසේ නොවන තම අත්සන රජයේ පාසල් ප්‍රධානියකු, විශ්‍රාමික ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු, රු. 240,360 ක් හෝ ඊට ඉහළ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙක් හෝ ලවා සහතික කරවා ගත යුතුය.

15. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018 මැයි මස 02 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කරන්න. ලිපි කවරයේ ඉහළ වම්පස කෙළවරේ අයදුම් කරන තනතුර නම් කර ''ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව'' යන්න සටහන් කළ යුතු වේ. එක් අයදුම්කරුවකුට අයදුම් කළ හැක්කේ එක තනතුරක් සඳහා පමණි.

අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය -

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාලාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503,
කොළඹ.

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

17. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් තීරණය කරනු ඇත.

වයි. ඩී. එස්. එස්. මල්සිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව,

අංක 251/2බී, 251/ඒ, කොළඹ පාර,
වත්තේගෙදර හංදිය, මහරගම.

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත සහ සීමිත තරග විභාග සඳහා වන අයදුම්පත්‍රය - 2018**

**Recruitment of Officers in Class III of the Sri Lanka Technical Service Application for Open and Competitive Examination - 2018**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

පෙනී සිටින්නේ විවෘත/ සීමිත විභාගයට ද යන වග :

විවෘත - 1
සීමිත - 2
විවෘත හා සීමිත යන දෙකටම - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

- රසායනාගාර කාර්මික III ශ්‍රේණිය - 1
- තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය - 2
- රසායනාගාර කාර්මික (එක් වසරක පුහුණු ශ්‍රේණිය) - 3
- රසායනාගාර කාර්මික (දෙවසරක පුහුණු ශ්‍රේණිය) - 4
- තාක්ෂණ නිලධාරී (සිවිල්) (එක් වසරක පුහුණු ශ්‍රේණිය) - 5
- තාක්ෂණ නිලධාරී (සිවිල්) (දෙවසරක පුහුණු ශ්‍රේණිය) - 6
- (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ඉල්ලුම්කරන තනතුර

(එක් අයදුම්කරුවකුට අයදුම් කළ හැක්කේ එක් තනතුරකට පමණි)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................................
(උදා :- HERATH MUDIYANSELAGE SAMAN KAUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
..........................................................................................................................
(උදා:- GUNAWARDHANA H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ........................................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ........................................................................................................................

2.2 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................................................................

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :

පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.3 අයදුම්පත් කැඳවන දිනට වයස :

අවුරුදු | | | මාස | | | දින | | |

3.4 දුරකථන අංකය : ස්ථාවර

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

ජංගම

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

04. 4.1 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද : ......................................................................................
4.2 උප සභාපති/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ...................................................................................
4.3 ග්‍රාම නිලධාරී කොට්ඨාසය : .....................................................................................................................

05. අධ්‍යාපන සුදුසුකම් :
5.1 අ.පො.ස. (සා.පෙළ) විභාග පිළිබඳ විස්තර :
I. විභාගයේ වර්ෂය සහ මාසය : ....................................................
II. විභාග අංකය : ........................................
III. ප්‍රතිඵල :

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර:
I. විභාගයේ වර්ෂය සහ මාසය : ..................................................
II. විභාග අංකය : ...............................................
III. ප්‍රතිඵල :

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

06. වෙනත් සුදුසුකම් :

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

07. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා අධිකරණයකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (✓) ලකුණ යොදන්න) ඔව් නම් විස්තර සඳහන් කරන්න :

ඔව් ☐ නැත ☐

.......................................................................................................................

.......................................................................................................................

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

I. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : ——————————
II. ලදුපත අංකය හා දිනය : ——————————
III. ගෙවූ මුදල : ——————————

| ලදුපත නොගැලපෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපත් පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වේ.) |
|---|

09. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කරමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/ හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් මා දන්නා තරමින් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඇ) තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

................................................... ,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ...................................................... .

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................................................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිටදී ........................................ දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

.............................................................................. ,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය: ....................................... .

11. සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ........................

I. තනතුර : .......................................
II. ලිපිනය : .......................................

12. රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණයි.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු වන ........................................ මහතා / මහත්මිය / මෙනෙවිය දැනට මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ............................................................. . වශයෙන් ස්ථිර/ තාවකාලික නිලධාරියෙක් බව ද, ඔහුට/ ඇයට මෙම පත්වීමේ රාජකාරි ඉටු කිරීමට හැකියාව ඇති/ නොමැති බව ද, සඳහන් කරමි. යම් හෙයකින් මෙම තනතුර සඳහා ඔහු/ ඇය තෝරාගනු ලැබුවහොත් මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට හැකියාව ඇති බව ද සඳහන් කරමි.

.................................................. ,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව.

දිනය : ....................................
නම : ....................................
තනතුර : ....................................
අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව : ..........................................

04-317

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2018/2019

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 28/2016 අනුව 2018/2019 අධ්‍යයන වර්ෂය සඳහා සුදුසුකම් සපුරාලන උපාධිධාරී නොවන නුපුහුණු ගුරුවරුන්ගෙන් ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙතෙක් විධිමත් පුහුණුව සම්පූර්ණ නොකළ ගුරුවරුන්/ ගුරු සහායකවරුන්, චක්‍රලේඛ අංක 28/2016 අනුව සකසා ගත් අයදුම්පත් 2018 අප්‍රේල් 27 දිනට ප්‍රථම "අධ්‍යාපන අධ්‍යක්ෂ, ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය.

මෙම චක්‍රලේඛය, අයදුම්පත හා උපදෙස් පත්‍රිකාව අධ්‍යාපන අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙන් ද (www.moe.gov.lk) ඕනෑම කලාප අධ්‍යාපන කාර්යාලයකින් ද ලබා ගත හැකි ය.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2018 අප්‍රේල් මස 06 වැනි දින,
ඉසුරුපාය, බත්තරමුල්ල.

04-335

---

## රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 වන පන්තියේ III ශ්‍රේණියේ, 1 වන පන්තියේ II ශ්‍රේණියේ සහ 1 වන පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2017 (II)

උක්ත කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාල විභාග නිවේදනය 2018.03.16 දිනැති *ගැසට් පත්‍රයේ* 03 - 672 යටතේ පළ කරන ලදී. එම නිවේදනයේ පහත සඳහන් කොටස් වැරදි ලෙස පළ වී ඇත.

02. එහි සිංහල පිටපතෙහි,

- 14.3.2 ඡේදයට පසුව ඇති වගුවෙහි අනු. අංක 02 යටතේ සටහන් කොටස මේ සමග යොමු කරන විභාග නිවේදනයේ පරිදි නිවැරදි විය යුතු ය.

එක් එක් විභාගයේ එක් එක් විෂයයන් පැවැත්වීමට සැලසුම්කර ඇති කාලසටහන පහත දැක්වේ :

| *අනු. අංකය* | *විභාගයේ නම* | *විෂයය* | *විෂය අංකය* | *දිනය* | *වේලාව* |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ආයතන සංග්‍රහය හා පරිපාලනය | 01 | 2018.04.07 | පෙ.ව. 09.00 - ප.ව. 12.00 |
| | | මුදල් රෙගුලාසි හා රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | 02 | 2018.04.07 | ප.ව. 12.30 - ප.ව. 3.30 |
| | | කළමනාකරණය හා සංවිධානය | 03 | 2018.04.08 | පෙ.ව. 09.00 - ප.ව. 12.00 |

| අනු. අංකය | විභාගයේ නම | විෂයය | | විෂයය අංකය | දිනය | වේලාව |
|---|---|---|---|---|---|---|
| 02 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | කාර්යාල කළමනාකරණය | | 04 | 2018.04.08 | පෙ.ව. 09.00- පෙ.ව. 10.00 |
| | | ඉ- රාජ්‍ය සංකල්පය හා තොරතුරු තාක්ෂණ කළමනාකරණය | I වැනි ප්‍රශ්න පත්‍රය - බහුවරණ | 05 - I | 2018.04.08 | පෙ.ව. 10.30 - ප.ව. 12.30 |
| | | | II වැනි ප්‍රශ්න පත්‍රය - රචනාමය | 05 - II | | |
| 03 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතිය | ව්‍යාපෘති වාර්තාව | 06 -I | ව්‍යාපෘති වාර්තාව සැකසීම හා භාර දිය යුතු දිනය පිළිබඳවත් ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කිරීම සම්බන්ධවත් අයදුම්පත් කැඳවන අවසාන දිනට පසුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ. | |
| | | | ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කිරීම | 06 -II | | |

15.0 මෙම විභාග නිවේදනයට විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

16.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2018 පෙබරවාරි මස 23 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

04-371

---

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (II) සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (I)**

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (II) සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (I) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අධීක්ෂණය සහ මෙහයවීම යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2018.05.05 වැනි දින සිට 2018.05.20 වැනි දින දක්වා සති අන්ත දිනවල දී කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. ඉහත සේවාවන්ට අදාළව පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග පරීක්ෂණය පහත සඳහන් පරිදි වේ :-

| අනු අංකය | විභාගයේ නම | සංකේත නාමය |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLAS 1 |
| 02 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLES |
| 03 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLSS |
| 04 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLArS |
| 05 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLAcSI |
| 06 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLPS I |
| 07 | ඉහත විභාගයට ඉල්ලුම් කළ හැකි වෙනත් සේවාවන් | other |
| 08 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLAS 2 |
| 09 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLAcS 2 |
| 10 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLPS 2 |

03. තමා කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාර වලදී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එසේකුදු වුවත් නියම කර ඇති කාල සීමාව තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම අත්‍යාවශ්‍ය වේ.

04. මෙම විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පවත්වනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

05. මෙම විභාගය සඳහා අයදුම් කිරීම අන්තර්ජාලය හරහා මාර්ගගත ක්‍රමයට (ONLINE) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.slida.lk වෙත පිවිසීමෙන් පමණක් කළ හැක. වෙබ් අඩවියේ මුල් පිටුවේ දකුණුපස තීරුවේ "Apply Online" වශයෙන් තිබෙන කොටසට පිවිස තමාට අදාල විභාගය තෝරා ගැනීමෙන් විභාග අයදුම්පත සම්පූර්ණ කළ හැක.

විභාග අයදුම්පත සම්පූර්ණ කිරීම 2018.04.06 වැනි දින පෙ.ව. 8.00 සිට 2018.04.23 වැනි දින රාත්‍රී 12.00 දක්වා වන කාලය තුළ පමණක් සිදු කළ හැක.

06. විභාග ගාස්තු - පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. මීට පෙර විභාගයට අයදුම්කර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් විභාග ප්‍රවේශ පත්‍රයක් ද නිකුත් කරනු ලදුව විභාග යට පෙනී නොසිටිය ද එය විභාගයට පෙනී සිටි වාරයක් ලෙස සැලකිය යුතු ය.

මීට පෙර විභාගයට පෙනී සිටි නිලධරයන් පහත පරිදි විභාග ගාස්තු ගෙවිය යුතු වේ :

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය එක් විභාගයක් ලෙසත්, දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය තවත් විභාගයක් ලෙසත් සලකා විභාග ගාස්තු ගෙවිය යුතුය. ඒ අනුව පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ එක් විෂයයකට පෙනී සිටින්නේනම් රු. 500 ක විභාග ගාස්තුවක් ගෙවිය යුතු වේ. ඒ අනුව පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ එක් විෂයයකට වඩා අයදුම් කරන්නේනම් රු. 1000 ක විභාග ගාස්තුවක් ගෙවිය යුතු වේ. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ එක් විෂයයකට වඩා අයදුම් කරන්නේනම් රු. 1000 ක විභාග ගාස්තුවක් ද, එක් විෂයයකට පමණක් පෙනී සිටින්නේනම් රු. 500 ක විභාග ගාස්තුවක්ද ගෙවිය යුතු වේ.

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ, නිලධාරීන් සඳහා වන

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයන්හි එක් විෂයයකට වඩා අයදුම් කරන්නේනම් රු. 1000 ක් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. එක් විෂයයකට පමණක් පෙනී සිටින්නේනම් රු. 500 ක විභාග ගාස්තුවක්ද ගෙවිය යුතු වේ.

විභාග ගාස්තු ශ්‍රී ලංකාව පුරා පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (උප තැපැල් කාර්යාල හැර) "SLIDA" ගිණුම වෙත ගෙවිය යුතු අතර ඒ ගෙවීමට අදාළව ලබා දෙන රිසිට් පතේ අංකය විභාග අයදුම්පතේ අදාළ ස්ථානයන්හි ඇතුළත් කළ යුතුය. අදාළ තැපැල් කාර්යාලයේදී "SLIDA" ගිණුම වෙත මුදල් ගෙවීමේ මෙරට විදුලි මුදල් ඇණවුම් ඉල්ලුම් පත්‍රය (තැ.කා.සි. 85) පිරවීමේදී, මුදල් ලබා ගන්නා ලෙස "SLIDA" යන්නද, මුදල් ලබන්නාගේ ලිපිනය යන ස්ථානයේ ඔබට අදාළ විභාගයේ සංකේත නාමයද සටහන් කරන්න. (සංකේත නාමයන් 02 වගන්තියේ දක්වා ඇති පරිදි විය යුතුය.)

තවද ගිණුම වෙත මුදල් ගෙවීමේදී මුදල් යවන්නා ලෙස අයදුම්කරුගේ නමද, මුදල් යවන්නාගේ ලිපිනය යන ස්ථානයේ අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකයද, ඇතුළත් කර ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුය.

07. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම.

මාර්ගගත (Online) ක්‍රමයට සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර ලද පසු අදාළ අයදුම්කරු වෙත තහවුරු කිරීමේ අංකයක් (Confirmation Number) ලබා දෙනු ලබන අතර එය ඉදිරි විමසීම් කටයුතු සඳහා අයදුම්කරු වෙත තබාගත යුතුවේ. අයදුම්කරුවන් විසින් නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත්‍රය මාර්ගගත (Online) යොමු කිරීමෙන් අනතුරුව ලැබෙන වෙබ් පිටුවේ ඇති උපදෙස් අනුගමනය කිරීමෙන් තමාට හිමි විභාග ප්‍රවේශ පත්‍රය ලබා ගැනීමට ඉඩ සැලසෙනු ඇත. එම ප්‍රවේශ පත්‍රය මුද්‍රණය කර දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු/ඇය විසින් ස්වකීය බලය පැවරූ නියෝජ්‍ය නිලධාරියෙකු වෙතින් තම අත්සන සහතික කරගත යුතුවේ. එසේ සහතික කරගත් විභාග ප්‍රවේශ පත්‍ර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් විභාග අපේක්ෂකයන් විසින් තම පෞද්ගලික ලිපිගොනුවේ ඇතුලත් කිරීම සඳහා සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලබා දිය යුතුය.

*සටහන* :- මාර්ගගත අයදුම්පත පිරවීමේ දී පෞද්ගලික ලිපිනය, සේවය කරන ආයතනය හා සේවා ස්ථානයේ ලිපිනය පැහැදිලිව ඇතුලත් කළ යුතුය.

08. අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් යම් ගැටළුවක් මතු වුවහොත් ඒ පිළිබඳ විමසීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 011-5980236 යන දුරකතන අංකය 2018.04.06 වැනි දින සිට 2018.04.23 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 08.30 සිට ප.ව. 04.15 දක්වා විවෘතව ඇත.

09. විභාග ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු දිය යුතුය. අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය තහවුරු කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් දුරකතන අංක 011-5980236 ඔස්සේ ඒ බව තහවුරු කර ගත හැකිය. විභාගයට පැමිණීම වෙනුවෙන් ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය වලින් මෙම විභාගය පැවැත්වෙන අතර යම් අපේක්ෂකයෙකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටි බැව් පසුව හෙළි වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. ස්වකීය අයදුම්පතෙහි දක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර නොමැත.

12. විභාග පරිපාටිය - එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂයයන් සහ විෂයය නිර්දේශයන් පහත සඳහන් පරිදි වේ. සෑම ප්‍රශ්න පත්‍රයකටම කාලය පැය තුන (03) කි. අයදුම්කරුවකු මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීම සඳහා සෑම විෂයයක් සඳහාම අවම වශයෙන් ලකුණු හතලිහ (40) ක් ලබාගත යුතුය.

12.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය : (අංක 1842/2 හා 2013.12.23 දිනැති *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 'උ' පරිශිෂ්ඨය)

මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ.

| *අනු අංකය* | *විෂයය* | | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|---|---|
| 01 | නීතිය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | පැය 03යි | 01 - I |
| | | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම | පැය 03යි | 01 - II |
| | | අපරාධ නීතිය හා සාක්ෂි නීතිය | පැය 03යි | 01 - III |
| 02 | පරිපාලනය | | පැය 03යි | 02 - I |
| 03 | ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව | | පැය 03යි | 03 |
| 04 | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | | පැය 03යි | 04 |

12.1.1 නීතිය

පහත සඳහන් කරුණු පදනම් වන ප්‍රශ්න පත්‍ර 03 කි.

**පළමුවන (I) ප්‍රශ්න පත්‍රය -**

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය (විෂයය අංකය 01-I) (ලකුණු 100යි)**

(i) ඓතිහාසික සංවර්ධනයද ඇතුලුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහය හා 1978 ජනරජ ව්‍යවස්ථාව
(ii) විධායකය, ජනරජයේ ජනාධිපති, අගමැති, අමාත්‍ය මණ්ඩලය හා රාජ්‍ය සේවය
(iii) යුක්තිය පසිඳලීම
(iv) පරිපාලනය සම්බන්ධ අධිකරණ පාලනය
(v) රාජ්‍ය ප්‍රතිපත්ති උදෙසා මාර්ගෝපදේශ ප්‍රතිපත්ති හා මූලික යුතුකම්
(vi) අභිනියෝජන ව්‍යවස්ථා
(vii) රජයේ හා රාජ්‍ය අධිකාරීන්හි වගකීම
(viii) මූලික අයිතිවාසිකම්

**දෙවන (II) ප්‍රශ්න පත්‍රය -**

**ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය (විෂයය අංකය 01-II) (ලකුණු 100යි)**

(i) යුක්තිය පසිඳලීම
(ii) ශ්‍රී ලංකාවේ නීති ඉතිහාසය
(iii) අධිකරණ සංවිධාන
(iv) ශ්‍රී ලංකාවේ උසාවි ආඥාපනත (6 පරිච්ඡේදය)
(v) 1971 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත

**තුන්වන (III) ප්‍රශ්න පත්‍රය -**

**අපරාධ නීතිය හා සාක්ෂි නීතිය (විෂයය අංකය 01-III) (ලකුණු 100යි)**

(i) දණ්ඩ නීති සංග්‍රහය
(ii) සාක්ෂි ආඥාපනත

අපේක්ෂකයෙකු නීති විෂය සමත් වීම සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකටම අවම වශයෙන් ලකුණු තිස්පහ (35) ක් හා මුළු ලකුණු වලින් සියයට හතලිහ (40%) ක සාමාන්‍යයක් ලබාගත යුතුය.

12.1.2. පරිපාලනය (විෂයය අංකය 02-I - ලකුණු 100 යි)
පහත සඳහන් කරුණු පදනම් වන එක් ප්‍රශ්න පත්‍රයකි

(i) කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම
(ii) ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද
I, II, III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII හා XLVIII, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති

12.1.3. ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව (විෂයය අංකය 03 - ලකුණු 100 යි)

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

පළමු (I) වන කොටස - ආර්ථික විද්‍යාව

(i) වටිනාකම, නිෂ්පාදනය හා බෙද හැරීමේ න්‍යායන් පිළිබඳ විශේෂ අවධානයක් සහිතව ආර්ථික විද්‍යාවේ මූලධර්ම
(ii) මුදල්, නිෂ්පාදනය හා බෙදහැරීම
(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය පිළිබඳ අවධානයක් සහිතව ශ්‍රී ලංකා ආර්ථික පසුබිම හා ආර්ථික සංවර්ධනයට අදළ ප්‍රතිපත්ති උපාය මාර්ග හා වැඩ සටහන්

දෙවන (II) වන කොටස - සමාජ විද්‍යාව

(i) සමාජ ව්‍යුහය සංවිධානය හා කාර්යයන්
(ii) මානව සම්බන්ධතා හා කණ්ඩායම්
(iii) බන්ධුත්වය, විවාහය හා පවුල
(iv) ග්‍රාමීය හා නාගරික සමාජය
(v) සමාජ ස්ථරායනය හා විභේදනය
(vi) සමාජීය පාලනය
(vii) සංස්කෘතිය, ආගම, සදචාරය හා හර පද්ධතීන්

අපේක්ෂකයකු ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව විෂයය සමත් වීම සඳහා එක් එක් කොටසට අවම වශයෙන් ලකුණු විස්ස (20) බැගින් ලබාගත යුතු ය.

12.1.4 රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය (විෂයය අංකය 04 - ලකුණු 100 යි)

පහත සඳහන් කරුණු පදනම් වන එක් ප්‍රශ්න පත්‍රයකි.

(i) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන
- රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය
- අරමුදල් යන්නෙහි අර්ථය
- ඒකාබද්ධ අරමුදල හා එහි ක්‍රියාකාරිත්වය
- විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම
- අවිනිශ්චිත අවස්ථා අරමුදල
- වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරිත්වය
- රාජ්‍ය ආදයම
- මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යභාරය
- භාණ්ඩාගාරයේ බලතල හා කාර්යභාරය
- වොරන්ට් හා අග්‍රිම අධිකාරිය
- විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්ය භාරය
- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA)
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE)

(ii) ගණන් දීමේ නිලධාරින්, ප්‍රධාන ගණන් දීමේ නිලධාරින් හා රාජ්‍ය ආදායම් පිළිබඳ ගණන් දීමේ නිලධාරින් පත් කිරීම, එම නිලධාරින්ගේ බලතල හා කාර්ය භාරය/වගවීම් හා වගකීම් ස්වභාවය

(iii) අභ්‍යන්තර විගණනය

(iv) රාජ්‍ය වියදම් සැලසුම්කරණය හා කළමනාකරණය
- සංවිධානවල අරමුණු හා කාර්යභාරයන් හඳුනා ගැනීම
- රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ, ඉලක්ක හා වැඩ සටහන් හඳුනා ගැනීම
- සංවර්ධන ව්‍යාපෘති, වැඩ සටහන් සැලසුම් කිරීම හා ඇගයීම් ප්‍රමුඛතාකරණය
- වාර්ෂික ආදයම් හා වියදම් ඇස්තමේන්තුව සැකසීම සහ අවසන් තීරණ ගැනීම

(v) අනුමත ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම
- වීරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය
- මුළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධනය කිරීම
- පරිපූරක ඇස්තමේන්තු

(vi) රජයේ දේපළවල පාඩු හා අත් හැරීම්
(vii) විවිධ ගිණුම් කටයුතු
(viii) මූල්‍ය කළමනාකරණය සඳහා කාර්යයන් පැවරීම
(ix) රජයේ මුදල්වල භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය
(x) රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය
- රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය
- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

12.2 ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය (අංක 1836/6 හා 2013.11.11 වැනි දිනැති *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ iii උපලේඛනය)

මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ.

| *අනු අංකය* | *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|---|
| 01 | පරිපාලනය | පැය 03යි | 02 - II |
| 02 | මූල්‍ය ක්‍රමය | පැය 03යි | 05 - I |
| 03 | දෙපාර්තමේන්තු/ආයතන ක්‍රමවේදයන් | මෙය ආයතන ප්‍රධානියා විසින් පවත්වනු ලබන බැවින් මෙම නිවේදනයේ ඒ සම්බන්ධව තොරතුරු පළ නොවේ. | |

එක් එක් විෂයය සමත්වීම සඳහා අවශ්‍ය අවම ලකුණු ගණන 40 කි.

12.2.1 පරිපාලනය (විෂයය අංකය 02 - II - ලකුණු 100යි)
1985 ප්‍රකාශයට පත් කරන ලද ආයතන සංග්‍රහයේ I කාණ්ඩය සහ 1999 ප්‍රකාශයට පත්කරන ලද ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ සියලුම පරිච්ඡේද සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යපටිපාටික රීති සංග්‍රහය මත (කාලීන සංශෝධනයන්ට යටත්ව) පදනම් වූ ඉංජිනේරු සේවාවේ කටයුතුවලට අදළ වන සේ සකස් කළ එක් ප්‍රශ්න පත්‍රයකි.

12.2.2 මූල්‍ය ක්‍රම (විෂයය අංකය 05 - I - ලකුණු 100යි)
1992 ප්‍රකාශයට පත් කරන ලද මූල්‍ය රෙගුලාසි හි IX හා X පරිච්ඡේදය හැර අනෙකුත් සියළුම පරිච්ඡේද සහ ජාතික ප්‍රසම්පාදන මාර්ග දර්ශක සංග්‍රහය (කාලීන සංශෝධනයන්ට යටත්ව) මත පදනම් වූ ඉංජිනේරු සේවාවේ කටයුතුවලට අදළ වන සේ සකස් කළ එක් එක් ප්‍රශ්න පත්‍රයකි.

12.3 ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය (2014.08.28 වැනි දිනැති අංක 1877/27 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 4 වන පරිශිෂ්ඨය) සහ

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය, (2014.08.28 වැනි දිනැති අංක 1877/28 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 4 වන පරිශිෂ්ඨය)

මෙම විභාගයන් සඳහා වන විෂයයන් පහත දැක්වේ.

| *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|
| මූල්‍ය ක්‍රමය | පැය 03යි | 05 - II |
| පරිපාලනය | පැය 03යි | 02 - III |
| දෙපාර්තමේන්තු රෙගුලාසි | මෙය ආයතන ප්‍රධානියා විසින් පවත්වනු ලබන බැවින් මෙම නිවේදනයේ ඒ සම්බන්ධව තොරතුරු පළ නොවේ. | |

12.3.1 මුල්‍ය ක්‍රම (විෂයය අංකය 05 - II - ලකුණු 100යි)

පහත සඳහන් කරුණු පදනම් වන එක් ප්‍රශ්න පත්‍රයකි.

(i) ශ්‍රී ලංකාවේ මුල්‍ය පාලනය
- රාජ්‍ය මුල්‍ය කළමනාකරණයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන
- රාජ්‍ය මුල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය
- අරමුදල් යන්තෙහි අර්ථය
- ඒකාබද්ධ අරමුදල හා එහි ක්‍රියාකාරිත්වය
- විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම
- අවිනිශ්චිත අවස්ථා අරමුදල
- වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරිත්වය
- රාජ්‍ය ආදායම
- මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යභාරය
- භාණ්ඩාගාරයේ බලතල හා කාර්යභාරය
- වොරන්ට් හා අග්‍රිම අධිකාරිය
- විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්ය භාරය
- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA)
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE)

(ii) ගණන් දීමේ නිලධාරීන්, ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා රාජ්‍ය අදායම් පිළිබඳ ගණන් දීමේ නිලධාරීන් පත් කිරීම, එම නිලධාරීන්ගේ බලතල හා කාර්ය භාරය/වගවීම් හා වගකීම් ස්වභාවය

(iii) අභ්‍යන්තර විගණනය

(iv) රාජ්‍ය වියදම් සැලසුම්කරණය හා කළමනාකරණය
- සංවිධානවල අරමුණු හා කාර්යභාරයන් හඳුනා ගැනීම
- රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ, ඉලක්ක හා වැඩ සටහන් හඳුනා ගැනීම
- සංවර්ධන ව්‍යාපෘති, වැඩ සටහන් සැලසුම් කිරීම හා ඇගයීම් පුමුඛතාකරණය
- වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තුව සැකසීම සහ අවසන් තීරණ ගැනීම

(v) අනුමත ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම
- වීරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය
- මුළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධනය කිරීම
- පරිපූරක ඇස්තමේන්තු

(vi) රජයේ දේපළවල පාඩු හා අත් හැරීම්
(vii) විවිධ ගිණුම් කටයුතු
(viii) මූල්‍ය කළමනාකරණය සඳහා කාර්යයන් පැවරීම
(ix) රජයේ මුදල්වල භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය
(x) රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය
- රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය
- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.3.2 පරිපාලනය (විෂයය අංකය 02 - III - ලකුණු 100යි)

පහත සඳහන් කරුණු පදනම් වන එක් ප්‍රශ්න පත්‍රයකි.

(i) ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII හා XLVIII

(ii) අංක 1589/30 දරන 2009.02.20 වැනි දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති.

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.4 ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධරයන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය : (අංක 1670/33 හා 2010.09.10 වැනි දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 03 වැනි පරිශිෂ්ඨය)
මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ.

| *අනු. අංකය* | *විෂය* | *කාලය* | *විෂය අංකය* |
|---|---|---|---|
| 01 | රජයේ මූල්‍ය පරිපාටි | පැය 03 | 06 |
| 02 | නීතිය හා කළමනාකරණය | පැය 03 | 07 |
| 03 | පරිපාලනය | පැය 03 | 02 - IV |
| 04 | වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම | පැය 03 | 08 |

12.4.1 රජයේ මූල්‍ය ක්‍රියා පරිපාටි (විෂය අංක 06) (ලකුණු 100)

රජයේ ගනුදෙනුවලට මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාරයේ චක්‍රලේඛ යොදා ගැනීම, රාජ්‍ය ආදායමට ඇති සම්බන්ධතාව අනුව මුදල් රෙගුලාසි/ක්‍රියා පිළිවෙත්, වියදම්, විදේශ ආධාර, වාර්ෂික හා අතිරේක ඇස්තමේන්තු, රජයේ ණය, සැපයුම් ටෙන්ඩරය, අග්‍රිම හා අත්තිකාරම් මුදල් අනුඥත, රාජ්‍ය ගිණුම්, කාර්යබද්ධ හා ආර්ථික වර්ගීකරණයන්, වැඩ සටහන් හා කාර්ය සාධන අයවැය, මුදල් අමාත්‍යවරයාගේ කාර්යයන්, මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, ලේකම්වරු, විගණකාධිපති හා රජයේ ගිණුම් කමිටුව සම්බන්ධයෙන් රජයේ මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර චක්‍රලේඛ යොදා ගනු ලබන ආකාරය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනීම පරීක්ෂා කෙරේ.

12.4.2 නීතිය හා කළමනාකරණය (විෂය අංක - 07) (ලකුණු 100)

නීතිය :

නීතිය පිළිබඳ නිර්වචනය
ශ්‍රී ලංකාවේ නීති පද්ධති
ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධති
ගිවිසුම් නීතිය
නියෝජිතායතන නීතිය
භාණ්ඩ විකිණීම
වාරික මුදල් ගෙවීමේ ක්‍රමයට මිලදී ගැනීම
ගනුදෙනු කළ හැකි පිළිනයක්
ඇප සහතික කිරීම
රක්ෂණය

කළමනාකරණය :

කළමනාකරණය පිළිබඳ හැඳින්වීම
කළමනාකරුවන්ගේ කාර්යයන් හා දක්ෂතා
සැලසුම් ක්‍රියාවලිය හා සංවිධාන මට්ටම් ඇති කිරීම
සංවිධාන ව්‍යුහය
මානව සම්පත් කළමනාකරණය
කාර්ය සාධන ඇගයීම
ප්‍රවර්ධනය
අභිප්‍රේරණය
නායකත්වය
සන්නිවේදනය
තීරණ ගැනීම
ගැටලු නිරාකරණය
වෙනස්වීම් කළමනාකරණය
කළමනාකරණ ගැටුම්
කළමනාකරණ කාලය
තත්ත්ව චක්‍ර නිෂ්පාදන හා ඵලය
කළමනාකරණ ආචාරධර්ම හා වගකීම්

12.4.3 පරිපාලනය (විෂය අංක - 02 - IV) (ලකුණු 100)

ආයතන සංග්‍රහයේ පරිච්ඡේද vii, ix, xi, xii, xv, xxiii, xxv, xxvi, xxvii, xxviii, xxix, xxx, xxxi, xxxii, xxxiii, xLvii හා xLviii සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති පළමුවන කාණ්ඩයේ i සිට vi දක්වා පරිච්ඡේද

12.4.4 වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම (විෂය අංක - 08) (ලකුණු 100)

කළමනාකරණ තොරතුරු සම්බන්ධයෙන් කාලානුරූප වීමේ නිරවද්‍යතාව සහ පරිපූර්ණ බවෙහි වැදගත්කම.

ආශ්‍රය තොරතුරු පරිහරණය
කාලානුරූප හා තදුචිත වාර්තා
රැස්වීම් වාර්තා හා සටහන් ලිවීම
කළමනාකරණ වාර්තා ව්‍යුහය
විශේෂයක් දක්විය යුතු වැදගත් ප්‍රතිඵල
ප්‍රතිඵල අර්ථකථනය
විචල්‍යයන් යෝජනා කිරීම
දත්ත විශ්ලේෂණයේ දී සංඛ්‍යානාම ක්‍රම භාවිතය
කාර්ය සාධනය සැසඳීම
කළමනාකරණ වාර්තාවල අනුපාත හා ප්‍රතිශත භාවිතය
රේඛා චිත්‍ර මගින් නිරූපණය
වෘත්තීයමය කථා හා දේශනවලට සවන්දීම
කථනයෙන් දේශන වාර්තා කිරීම
විෂය මඩුලු සාකච්ඡා
සම්මන්ත්‍රණ දක්ෂතා
කථා පැවැත්වීම

*සටහන* :-සාමාර්ථය සඳහා අයදුම්කරුවන් සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.5 ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා පැවැත්වෙන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය. (අංක 1670/32 හා 2010.09.10 වැනි දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 'ඇ' පරිශිෂ්ඨය)

මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ.

| *අනු අංකය* | *විෂයය* | *කාලය (පැය)* | *විෂය අංකය* |
|---|---|---|---|
| 01 | ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන | 03 | 09 |
| 02 | ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය | 03 | 10 |
| 03 | ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 03 | 11 |
| 04 | ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍ය ක්‍රම | 03 | 12 |
| 05 | ඉංග්‍රීසි භාෂාව | 03 | 13 |

12.5.1 සේවා ව්‍යවස්ථාවේ හා පත්වීම් ලිපියේ විධිවිධාන පරිදි නියමිත කාල සීමාව තුළ හෝ ඊට පෙර විභාගය සමත් විය යුතු අතර, සියලුම විෂයයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කීපයක දී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර ඇත.

විභාග පටිපාටිය

12.5.2 ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන (විෂයය අංක - 09) (ලකුණු 100යි)

(i) ජාතික පරමාර්ථ හා ප්‍රමුඛතාවයන් සහ ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රමසම්පාදන ප්‍රතිපත්ති රාමුව සහ වැඩසටහන් ;

(ii) ජාතික ක්‍රමසම්පාදනය සඳහා විධි ශාස්ත්‍රය ක්‍රමසම්පාදනයෙහිලා ප්‍රධාන ගැටලු තැන්, පොදු ජන සහභාගිත්වය, සම්පත් යෙදවීම ආදිය ;

(iii) ජාතික ක්‍රමසම්පාදනය සඳහා දත්ත ස්වභාවය සහ මූලාශ්‍ර, දත්ත රැස්කිරීම, අර්ථ නිරූපණය ඉදිරිපත් කිරීම සහ විශ්ලේෂණය, ක්ෂේත්‍ර අධීක්ෂණ හා විමර්ශන, ජන විකාශ සංකල්ප, ආර්ථික විද්‍යා ප්‍රක්ෂේපණ හා ප්‍රතිපත්ති විශ්ලේෂණ.

12.5.3 ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය (විෂයය අංකය - 10) (ලකුණු 100යි)

(i) නිපැයුම හා බෙද හැරීම පිළිබඳ න්‍යායයන් කෙරෙහි විශේෂ සැලකිල්ලකින් යුතුව ආර්ථික විද්‍යා මූලධර්ම;
(ii) මුදල්, බැංකු ක්‍රම, ජාත්‍යන්තර මූල්‍ය ක්‍රම හා වෙළඳාම;
(iii) මූල්‍ය, මුදල්, වෙළෙඳ හා තීරුබදු ප්‍රතිපත්ති විශ්ලේෂණය ;
(iv) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය ;
(v) ආර්ථිකය සමාලෝචනය කිරීම ;
(vi) ශිල්පීය පුහුණු සහ නුපුහුණු මිනිස් බලය සහ විදේශාධාර ඇතුළු වෙනත් සම්පත් තක්සේරු කිරීම සහ ඒවා උපයෝගීකරණය ;
(vii) ආර්ථික විද්‍යාත්මක සහ සමාජයීය සිද්ධි ;
(viii) ආර්ථික විශ්ලේෂණය සහ ක්‍රමසම්පාදනයෙහි ලා උපයෝගී කරගන්නා මූලික සංඛ්‍යානය සංකල්ප හා ක්‍රම ;
(ix) ප්‍රතිලාභ/පිරිවැය විශ්ලේෂණ මූලධර්ම.

12.5.4 ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ පසු විපරම් කටයුතු (විෂයය අංකය - 11) (ලකුණු 100යි)

(i) ව්‍යාපෘති සැලසුම් කිරීම, හඳුනා ගැනීම සහ නිර්වචනය කිරීම හා ව්‍යාපෘති සම්පාදනය, ප්‍රතිපත්ති, සිද්ධාන්ත, ස්ථානය තෝරා ගැනීම, තාක්ෂණය සහ පිරිවැය සහ ප්‍රතිලාභ ඇස්තමේන්තු කිරීම, තාක්ෂණික මූල්‍ය සහ ආර්ථික විශ්ලේෂණය;

(ii) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම/අධීක්ෂණය, ව්‍යාපෘති සහ වැඩසටහන් නිසියාකාරව සහ කාලීනව ක්‍රියාත්මක කිරීම, සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ උපලේඛන සැකසීම, පසුවිපරම් සහ ප්‍රගති පාලනය සම්බන්ධීකරණය සහ ඉදිරි කටයුතු ;

(iii) ව්‍යාපෘති ඇගයීම, ව්‍යාපෘතිවල සහ වැඩසටහන්වල සාකල්‍යය තක්සේරු කිරීම, පිරිවැයට සාපේක්ෂව ප්‍රතිලාභ විශ්ලේෂණය ;

12.5.5 ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍ය ක්‍රම (විෂයය අංකය - 12) (ලකුණු 100යි)

(i) ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (x වන පරිච්ඡේදය හැර) ;

(ii) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII, IX, XI, XII, XV, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති පළමුවන කාණ්ඩයේ I සිට VI දක්වා පරිච්ඡේද ;

(iii) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය : රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන, රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය, ඒකාබද්ධ අරමුදල සහ එහි ක්‍රියාකාරිත්වය, විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම, රාජ්‍ය ආදායම, මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්ය භාරය, භාණ්ඩාගාරයේ බලතල හා කාර්ය භාරය, වොරන්ට් සහ අග්‍රිම අධිකාරිය, විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්ය භාරය, රාජ්‍ය වියදම් කමිටුව, රාජ්‍ය ව්‍යාපාර කමිටුව ;

(iv) ගිණුම් නිලධාරීන්, ප්‍රධාන ගිණුම් නිලධාරීන් හා රාජ්‍ය ආදායම පිළිබඳ ගිණුම් නිලධාරීන් පත් කිරීම, ඔවුන්ගේ බලතල හා කාර්යභාරය ;

(v) රාජ්‍ය වියදම් සැලසුම් කිරීම හා කළමනාකරණය, සංවිධානවල අරමුණු හා කාර්යභාරයන් හඳුනා ගැනීම, වාර්ෂික ආදායම් හා ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම, අනුමත වියදම් ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම, වීරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය, පරිපූරක ඇස්තමේන්තු.

(vi) රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය :- භාණ්ඩ සේවා හා වැඩ ලබා ගැනීම, ටෙන්ඩර් මණ්ඩලය හා තාක්ෂණ ඇගයුම් කමිටුවල සංයුතිය, පත්කිරීම්, බලතල හා කාර්ය භාරය, ටෙන්ඩර් ඇගයීමේ ක්‍රියා පටිපාටිය, විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල කළමනාකරණය ;

12.5.6 ඉංග්‍රීසි භාෂාව (විෂයය අංකය - 13) (ලකුණු 100යි)

ක්‍රමසම්පාදනය, සංවර්ධනය, සැලසුම්කරණය සහ කළමනාකරණය යන විෂයයන්ට අදාළව අපේක්ෂකයන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය, ඉංග්‍රීසි භාෂා කුසලතාවය මැනීම සඳහා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

12.6 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය : (අංක 1842/2 හා 2013.12.23 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 'ඌ' පරිශිෂ්ඨය)

මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

මෙම විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ.

| *අනු අංකය* | *විෂයය* | *කාලය (පැය)* | *විෂය අංකය* |
|---|---|---|---|
| 01 | ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | පැය 03යි | 14 |
| 02 | සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | පැය 03යි | 15 |
| 03 | කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය | පැය 03යි | 16 |
| 04 | සන්ධාන භාෂා ප්‍රවීණතාව (ඉංග්‍රීසි) | පැය 03යි | 17 |

12.6.1 ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) (විෂයය අංකය - 14) (ලකුණු 100යි)

ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික, සමාජ හා දේශපාලන ඉතිහාසය තුළ ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යා මූලධර්මයන් උපයෝගී කරගෙන ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා බලපාන කරුණු මත පදනම් වූ ප්‍රශ්න පත්‍රයකි.

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.6.2 සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) (විෂයය අංකය - 15) (ලකුණු 100යි)

පහත සඳහන් කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් සංවර්ධන පරිපාලනය භාරවූ ආයතන ඒවායේ ක්‍රියාකාරිත්වය හා අන්තර් සම්බන්ධතාවයන් මත පදනම් වූ ප්‍රශ්න පත්‍රයකි.

(i) ශ්‍රී ලංකාවේ රාජ්‍ය යාන්ත්‍රණය
(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය යාන්ත්‍රණය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පසුබිම
(iii) පළාත් සභා හා පළාත් පාලන ආයතන
(iv) මහජන සංවිධාන
(v) රාජ්‍ය සංස්ථා

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.6.3 කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය (විෂයය අංකය - 16) (ලකුණු 100යි)

පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කෙරෙන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකි.

(i) රාජ්‍ය ආයතන සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයේ වැදගත්කම.
(ii) දත්ත විශ්ලේෂණය හා වාර්තා සැකසීම.
(iii) දත්ත සමුදය කළමනාකරණය හා තොරතුරු ආපසු ලබාගැනීම.
(iv) ව්‍යාපෘති කළමනාකරණයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය.
(v) කළමනාකරණ තොරතුරු පද්ධති සැකසීම.

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.6.4 සන්ධාන භාෂා ප්‍රවීණතාව (ඉංග්‍රීසි) (විෂයය අංකය - 17) (ලකුණු 100යි)

Scheme of Evaluation : Written Examination
Content : The following subjects area are suggested for the candidates' reference.

- Communication Skills

The candidates should posses the ability to function effectively in the following language functions :

- General Greetings and Introductions
- Giving and Getting Information
- Advising Suggesting and Expressing Opinions
- Describing Events and Situation
- Telephone Skills
- Interviewing Skills
- Expression Skills
- Listening and Note Taking Skills

- Writing Skills

The Knowledge on the modern formats and styles of writing is tested in this area of study

- Internal Modes of Communication
- Formal Correspondence Skills
- Writing Descriptions/Explanation
- Grammer

- Summary writing Skills
- Report writing Skills
- Meeting Minutes/Agendas/Invitation

• Comprehension Skills

Candidate's ability to comprehend a printed text infer meaning and verbal/written interpretation is expected

- Reading and understanding the specific and general meaning of a printed text
- Reading and interpretation (verbal/written)
- Understanding the cohesion and coherence of a passage

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.7 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය : (අංක 1670/33 හා 2010.09.10 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 04 වැනි පරිශිෂ්ඨය)

මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ.

| *අනු අංකය* | *විෂයය* | *කාලය* | *විෂය අංකය* |
|---|---|---|---|
| 01 | කළමනාකරණ ගණකාධිකරණය | පැය 03යි | 18 |
| 02 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | පැය 03යි | 19 |
| 03 | කළමනාකරණය හා සංවිධානය | පැය 03යි | 20 |

12.7.1 කළමනාකරණ ගණකාධිකරණය (විෂයය අංකය - 18) - පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු 100යි)

ප්‍රශ්න තෝරා ගැනීමට ඉඩ දෙනු නොලැබේ.

ගිණුම් ප්‍රතිපෝෂක පිළිබඳ පාලන න්‍යාය, විවෘත සහ සංවෘත, මූලික හා ව්‍යවහාරික ප්‍රශස්ත, සම්මත පිරිවැය ක්‍රම, කාර්යඵල ප්‍රමිති සහ ඇගයීම ප්‍රමිති පිළිබඳ මූලධර්ම හා ඒවා යොදා ගැනීමේ ව්‍යාවහාර ක්‍රම, ප්‍රමිති සංශෝධනය, ඉගෙනුම් වක්‍ර සහ අභිප්‍රේරණය නිර්ණය කිරීම, විචලනයන් සහ උපවිචලනයන් විශ්ලේෂණය කිරීම, ඒවායේ වැදගත්කම, ඉදිරිපත් කිරීම සහ විභාග කිරීම, පාලන ගණකාධිකරණයේ චර්යාන්ත අංගයන්, අයවැය ලේඛන සම්පාදනය කිරීමේ සංකල්පය, අයවැය පාලනය පිළිබඳ පරිපාලනය, අයවැය ලේඛන සංග්‍රහය, ස්ථාවර හා නම්‍ය අයවැය ලේඛන, ප්‍රධාන සහ අතුරු අයවැය ලේඛන, අයවැය කේන්ද්‍ර, අයවැය පිළියෙල කිරීමෙහිලා කළමනාකරණ සහභාගිත්වය, මැදිහත්වීම සහ අභිප්‍රේරණය, අයවැය කාලසීමාව සහ ප්‍රධාන අයවැය සාධකය හඳුනා ගැනීම.

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.7.2 රාජ්‍ය මූල්‍ය කළමනාකරණය (විෂයය අංකය - 19) - පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු 100යි)

ප්‍රශ්න තෝරා ගැනීමට ඉඩ දෙනු නොලැබේ.

රජයේ ගණකාධිකාරීවරයාගේ කාර්ය භාරය.

රාජ්‍ය මුදල් පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නෛතික රාමුව, ආයතනික රාමුව, මධ්‍යම ආණ්ඩුව, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන, සමූපකාර ව්‍යාපාරය යනාදිය.

පාර්ලිමේන්තුවේ පාලනය, මහා භාණ්ඩාගාරයේ කාර්යයන්, ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ඇස්තමේන්තු කාරක සභාව, විගණකාධිපති, රාජ්‍ය ගිණුම් කාරක සභාව, ඒකාබද්ධ අරමුදල, පාර්ලිමේන්තුව විසින් කරනු ලබන පාලනයන් පිළිබඳ ගැටලු මූල්‍ය චක්‍රය, ක්‍රමසම්පාදන වැඩ සටහන් සැකසීම, අයවැය ලේඛන සම්පාදනය, අරමුදල් අනුමත කිරීම, ගිණුම් තැබීමේ කටයුතු, වාර්තා කිරීම, ඇගයුම හා විගණනය.

ව්‍යාපෘති අගයනය කිරීම, සේවා මිල ගණන් සහ සංඛ්‍යානමය දත්ත භාවිතය, ගෙවීම් න්‍යාය සහ අපේක්ෂිත අගය තීරණය කිරීම.

පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය, වට්ටම් කළ මුදල් ප්‍රවාහය, අභ්‍යන්තර ඵලද අනුපාතිකය, ව්‍යාපෘති තත්ත්වායනය, ව්‍යාපෘති සම්පාදනය සහ අගයනය කිරීම පිළිබඳව ආර්ථික මූල්‍ය හා කළමනාකරණ අංශ, සාර්ථක ලෙස ව්‍යාපෘති ඉදිරිපත් කිරීම.

වැඩ සටහන් සම්පාදනය කිරීමේ ශිල්ප ක්‍රම, ජාල විශ්ලේෂණ ක්‍රම භාවිත කිරීම, සම්පත් පැවරීම, ප්‍රවාහනය පිළිබඳ ගැටලු, ප්‍රයෝජනයට ගැනීම හෝ කාලයාගේ ඇවෑමෙන් පිරිහීමට පත් වන වත්කම් සහ එසේ පිරිහීමට පත් නොවන, එහෙත් යම් කලක් පාවිච්චි කිරීමෙන් හෝ කලක් ගතවීමෙන් පසුව හෝ නිශ්ඵල බවට පත්වන වත්කම් වෙනුවට වත්කම් යෙදීම, කාර්ය සාධන අයවැය ලේඛන, මූලික ක්‍රම ස්ථාපනය සහ භාවිතය, කාර්ය සාධනය මැනීම, මිණුම් වර්ග, ඒකක සහ ප්‍රතිමාන තේරීම, මිනුම් ක්‍රම සහ කාර්ය සාධන විශ්ලේෂණය.

වැඩ සටහන් අයවැය, වැඩ සටහන් ව්‍යුහය, කාර්යන් අනුව වර්ගීකරණය, වැඩ සටහන් කටයුතු, වැය ව්‍යාපෘතීන් සහ වැය විෂයයන්, ආර්ථික සහ කාර්ය බද්ධ වර්ගීකරණය.

මූල්‍ය පාලන ක්‍රම, වගකීම් භාරය, අභ්‍යන්තර පාලනය සහ මුදල් රෙගුලාසි, අභ්‍යන්තර විගණනය, කාර්යක්ෂමතා විගණනය, කළමනාකරණ විගණනය, විචල්‍යතා විශ්ලේෂණය, ප්‍රාග්ධන අයවැය, සම්පාදනය කිරීම පිළිබඳ තීරණය, දිගුකාලීන ක්‍රම සම්පාදනය සහ එහි වැදගත්කම, පූර්වකථනය කිරීම, නිරවද්‍යතාව සහ සීමාවන්, අවදනම් විශ්ලේෂණය, තීරණ වෘක්ෂ, සම්භාවිත සාධක.

ප්‍රාග්ධනය සඳහා ඉල්ලුම, ප්‍රාග්ධන ඵලදායිකත්වය සහ ඉපයුම් ඇස්තමේන්තු කිරීම පිළිබඳ ගැටළු, ව්‍යාපෘති ප්‍රමුඛතාවන් තත්ත්වායනය කිරීමේදී අවිනිශ්චිතතාවන් සඳහා ඉඩ තැබීම, පිළිගෙවුම් නිශ්චායකයන්, ඵල අනුපාතිකය ගණනය කිරීම, ශුද්ධ වර්තමාන අගය සහ වට්ටම් කළ මුදල් ප්‍රවාහයේ ප්‍රතිලාභ, අයබදු ගැනීමේ බලපෑම, ආයෝජන ප්‍රොත්සහනය, ව්‍යාපෘති පිරිවැය පාලනය සහ පශ්චාත් විගණනය.

හැකියා පිළිබඳ තීරණ - නිෂ්පාදන ප්‍රකීර්ණකය, නිෂ්පාදනය කිරීම හෝ මිලට ගැනීම, විකල්ප නිෂ්පාදන ක්‍රම, කර්මාන්ත ශාලා වසා දැමීම පිළිබඳ ගැටළු, මිල කිරීමේ ප්‍රතිපත්ති සහ දයක න්‍යාය, පාරිභෝගික ඉල්ලුම් රටාවන්ගේ බලපෑම, ඉල්ලුම් නම්‍යතාව, අලෙවි කිරීමේ උපාය මාර්ග, කාර්ය සාධන ඇගයීමේ ශිල්ප ක්‍රම, ලාභදායකත්වය පිළිබඳ නිශ්චායකයන් සහ අනුපාත.

පිරිවැය වාසි විශ්ලේෂණය, කාරක ප්‍රාග්ධන කළමනාකරණය.
රාජ්‍ය වාණිජ ව්‍යාපාරවල මුදල් පාලනය, අයවැය සම්පාදනය, කළමනාකරණ වාර්තා කිරීම, ගිණුම් අර්ථකථනය සහ මුදල් අනුපාත භාවිතය.

රාජ්‍ය ව්‍යවසායන්හි මිල නියම කිරීම.

ගිණුම් සැලැස්ම අන්තර්ගත කරුණු, රජයේ වාර්තා සහ රාජ්‍ය ව්‍යාපාර.

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

**12.7.3 කළමනාකරණය හා සංවිධානය (විෂයය අංකය - 20) - පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු 100යි)**

ප්‍රශ්න තෝරා ගැනීමට ඉඩ දෙනු නොලැබේ.

කළමනාකරණය හා සංවිධාන මූලධර්ම පිළිබඳ අපේක්ෂකයාගේ අවබෝධය, රාජ්‍ය අංශයේ ගැටළු සහ ප්‍රශ්න සම්බන්ධයෙන් මෙම මූලධර්ම භාවිතය මෙන්ම නවීන කළමනාකරණ උපක්‍රම සහ ශිල්ප ක්‍රම පිළිබඳ ඔහුගේ දැනුම නිර්ණය කිරීම පිණිස මෙම විෂයය අළලා ප්‍රශ්න සකස් කරනු ඇත.

***සටහන*** :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

**12.8 ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය : (අංක 1670/32 හා 2010.09.10 වැනි දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 'ඇ' වැනි පරිශිෂ්ඨය)**

මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීම සුදුසුකම් ලබයි.

12.8.1 දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත විය යුතු වනු ඇත. විෂයයන් පහත දැක්වේ.

| *අනු අංකය* | *විෂයය* | *කාලය (පැය)* | *විෂය අංකය* |
|---|---|---|---|
| 01 | සංවර්ධන සැලසුම් ශිල්ප ක්‍රම | 03 | 21 |
| 02 | මූලික සාර්ව ආර්ථික විද්‍යාව | 03 | 22 |
| 03 | වර්තමාන ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම | 03 | 23 |

**12.8.2 ප්‍රශ්න පත්‍රයේ ඇති සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.**

*විභාග පටිපාටිය :*

I. *සංවර්ධන සැලසුම් ශිල්ප ක්‍රම (විෂය අංකය - 21) (ලකුණු 100)*
(I) ස්වොට් විශ්ලේෂණය (SWOT)
(II) ගැටළු වෘක්ෂය
(III) තර්ක රාමු විශ්ලේෂණය
(IV) පිරිවැය - ප්‍රතිලාභ විශ්ලේෂණය
(V) පිලි ලදුව ක්‍රමවේදය
(VI) ශුද්ධ වර්තමාන අගය
(VII) අභ්‍යන්තර ඵලද අනුපාතය
(VIII) ජායා මිල යොද ගැනීම

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

II. *මූලික සාර්ව ආර්ථික විද්‍යාව (විෂය අංකය - 22) (ලකුණු 100)*
(I) ජාතික ගිණුම්
(II) ආර්ථික වර්ධන වේගය
(III) සමතුලිත ජාතික ආදයම
(IV) ගුණිත ප්‍රතිවිපාකය
(V) උද්ධමනය
(VI) පොළී අනුපාතය
(VII) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ හැඳින්වීමක්
(VIII) මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ හැඳින්වීමක්
(IX) වෙළෙඳ චක්‍ර

***සටහන*** :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

*III. වර්තමාන ජාත්‍යන්තර ආර්ථික අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම (විෂය අංකය - 23) (ලකුණු 100)*

වර්තමාන ජාත්‍යන්තර ආර්ථික අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම (ඒ ඒ අවස්ථාවේ ඇතිවන ලෝක ආර්ථික තත්ත්වයන්ට කාලීනව ගැළපෙන මාතෘකාවලට අදාළව පිළිතුරු සැපයීමට සිදුවේ.)

***සටහන*** :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13. මෙම විභාගය සඳහා වන විභාග කාල සටහන පහත පරිදි වේ.

| *අනු. අංකය* | *විභාගයේ නම* | *විෂයය* | *විෂය අංකය* | *දිනය* | *වේලාව* |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | 01 - I | 2018.05.05. | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම | 01 - II | 2018.05.05. | ප.ව. 12.30 - ප.ව. 3.30 |
| | | අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය | 01 - III | 2018.05.06 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | පරිපාලනය | 02 - I | 2018.05.06 | ප.ව. 12.30 - ප.ව. 3.30 |
| | | ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව | 03 | 2018.05.12 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 04 | 2018.05.12 | ප.ව. 12.30 - ප.ව. 3.30 |
| 02 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 05 - I | 2018.05.06 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | පරිපාලනය | 02 - II | 2018.05.06 | ප.ව. 12.30 - ප.ව. 3.30 |
| 03 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 05 - II | 2018.05.05 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | පරිපාලනය | 02 - III | 2018.05.05 | ප.ව. 12.30 - ප.ව. 3.30 |
| 04 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 05 - II | 2018.05.05 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | පරිපාලනය | 02 - III | 2018.05.05 | ප.ව. 12.30 - ප.ව. 3.30 |
| 05 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | රජයේ මූල්‍ය පරිපාටි | 06 | 2018.05.12 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | නීතිය හා කළමනාකරණය | 07 | 2018.05.12 | ප.ව. 12.30 - ප.ව. 3.30 |
| | | පරිපාලනය | 02 - IV | 2018.05.13 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම | 08 | 2018.05.13 | ප.ව. 12.30 - ප.ව. 3.30 |

| අනු අංකය | විභාගයේ නම | විෂයය | විෂය අංකය | දිනය | වේලාව |
|---|---|---|---|---|---|
| 06 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරින් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන | 09 | 2018.05.12 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය | 10 | 2018.05.12 | ප.ව. 12.30 - ප.ව. 3.30 |
| | | ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 11 | 2018.05.13 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍ය ක්‍රම | 12 | 2018.05.13 | ප.ව. 12.30 - ප.ව. 3.30 |
| | | ඉංග්‍රීසි භාෂාව | 13 | 2018.05.19 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| 07 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | 14 | 2018.05.19 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | 15 | 2008.05.19 | ප.ව. 12.30 - ප.ව. 3.30 |
| | | කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය | 16 | අයදුම්පත් කැඳවන අවසාන දිනට පසුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලබන දිනය අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ. | |
| | | සන්ධාන (ඉංග්‍රීසි) භාෂා ප්‍රවීණතාව | 17 | 2018.05.20 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| 08 | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | කළමනාකරණ ගණකාධිකරණය | 18 | 2018.05.19 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 19 | 2018.05.19 | ප.ව. 12.30 - ප.ව. 3.30 |
| | | කළමනාකරණය හා සංවිධානය | 20 | 2018.05.20 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| 09 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | සංවර්ධන සැලසුම් ශිල්ප ක්‍රම | 21 | 2018.05.19 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | මූලික සාර්ව ආර්ථික විද්‍යාව | 22 | 2018.05.19 | ප.ව. 12.30 - ප.ව. 3.30 |
| | | වර්තමාන ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම | 23 | 208.05.20 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |

14. 14.1 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළ විෂයයන්ගේ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම පහත පරිදි වේ.

| *විභාගය* | *විෂය* | *නිදහස් කරනු ලැබීමට අවශ්‍ය සුදුසුකම්* |
|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | නීතිය | බැරිස්ටර්වරයෙකු, ශ්‍රේෂ්ඨාධිකරණයේ අධි නීතිඥවරයකු, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධිධාරියකු වීම |

*සටහන 1 :* අංක 1419/3 හා 2005.11.14 වැනි දිනැති ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව යටතේ 2012.07.01 වැනි දින සිට 2013.12.23 වැනි දින දක්වා බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා ද එම සේවා ව්‍යවස්ථාවේ පරිදි පළමුවන කාර්යක්ෂමතා කඩඉමෙහි සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව සඳහා ලබා දුන් නිදහස් කිරීම අදාල වේ.

14.2 ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ අන්තර්කාලීන විධිවිධාන 1.5 (ආ) පරිදි එම ව්‍යවස්ථාව බලාත්මක වන දිනට (2012.07.01) පෙර පැවති ව්‍යවස්ථා විධිවිධාන යටතේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් විය යුතුව තිබූ නමුත් 2014.12.31 වැනි දිනට එසේ සමත් වීමට අපොහොසත් වන නිලධාරීන්, පැවති ව්‍යවස්ථාවට අනුව එක් එක් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයයන්ට අනුරූපි වන දැනට ක්‍රියාත්මක ව්‍යවස්ථාව යටතේ පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවල විෂයයන් සමත් වීමෙන් කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතුය. අනුරූපි විෂයයන් පහත සඳහන් වගුවෙහි දැක්වේ.

| | අංක 1419/3 හා 2005.11.14 වැනි දිනැති පූර්ව සේවා ව්‍යවස්ථාව | අංක 1842/2 හා 2013.12.23 වැනි දිනැති නව සේවා ව්‍යවස්ථාව |
|---|---|---|
| 01. | නීතිය (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | නීතිය (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 02. | පරිපාලනය (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | පරිපාලනය (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 03. | ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 04. | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 05. | ඉංග්‍රීසි (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | සන්ධාන භාෂා ප්‍රවීණතාව (ඉංග්‍රීසි) (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 06. | ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 07. | සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 08. | කළමනාකරණය සහ සංවිධානය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |

15. *ප්‍රතිඵල නිකුත් කිරීම* - මෙම විභාගයට අයදුම් කළ / පෙනී සිටි සියලු අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ. ඉලෙක්ට්‍රොනික ලේඛන හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය පිළිබඳව වූ ජනාධිපති ලේකම්ගේ අංක : SP/SB/1/13 හා 2009.10.13 වැනි දිනැති චක්‍රලේඛය අනුව අමාත්‍යාංශ වෙබ් අඩවියේ සඳහන් ප්‍රතිඵල පළ කිරීම නිලධාරීන්ට ප්‍රතිඵල නිකුත් කිරීමක් ලෙස සැලකිය යුතුය. මේ අනුව දෙපාර්තමේන්තු ප්‍රධානීන් අමාත්‍යාංශ වෙබ් අඩවියේ සඳහන් ප්‍රතිඵල ලේඛනවල අදළ පිටපත් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු වලට ඇතුළත් කළ යුතුය. ප්‍රතිඵල නැවත සමීක්ෂණයට අවසර දෙනු නොලැබේ.

16. මෙම විභාග නිවේදනයට විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

17. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

ජේ.ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2018 මාර්තු මස 22 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

04 - 369

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | | *තැපැල් ගාස්තුව* | |
|---|---|---|---|---|
| | *රු.* | *ශ.* | *රු.* | *ශ.* |
| I වැනි කොටස : | | | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 | 0 | 9,340 | 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 | 0 | 950 | 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 | 0 | 750 | 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 | 0 | 2,500 | 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 | 0 | 450 | 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 | 0 | 275 | 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 | 0 | 4,360 | 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 | 0 | 3,640 | 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 | 0 | 1,250 | 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 | 0 | 5,520 | 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | | තැපැල් ගාස්තුව | |
|---|---|---|---|---|
| I වැනි කොටස : | *රු.* | *ශ.* | *රු.* | *ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 | 0 | 60 | 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 | 0 | 60 | 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 | 0 | 60 | 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 | 0 | 120 | 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 | 0 | 60 | 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 | 0 | 60 | 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 | 0 | 60 | 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 | 0 | 60 | 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 | 0 | 60 | 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2018** වර්ෂය | | | |
| අප්‍රේල් | 2018.04.06 | සිකුරාදා | 2018.03.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.04.12 | බ්‍රහස්පතින්දා | 2018.03.29 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2018.04.20 | සිකුරාදා | 2018.04.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.04.27 | සිකුරාදා | 2018.04.12 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| මැයි | 2018.05.04 | සිකුරාදා | 2018.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.05.11 | සිකුරාදා | 2018.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.05.18 | සිකුරාදා | 2018.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.05.25 | සිකුරාදා | 2018.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2018.06.01 | සිකුරාදා | 2018.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.06.08 | සිකුරාදා | 2018.05.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.06.14 | බ්‍රහස්පතින්දා | 2018.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.06.22 | සිකුරාදා | 2018.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.06.29 | සිකුරාදා | 2018.06.14 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.